e-සභා

## පළාත් පාලන ආයතන තුළ හඬට ඉඩක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ

# මාර්ගෝපදේශ සංග්‍රහය



USAID
FROM THE AMERICAN PEOPLE

CIVIL SOCIETY & MEDIA
STAND

HELP-O

**"This publication is made possible by the generous support of the American people through the United States Agency for International Development (USAID), under the terms of award no. 72038322RFA00001. The contents are the responsibility of Human and Environment Links Progressive Organization (HELP-O) and do not necessarily reflect the views of Pact Inc, The Asia Foundation, USAID, or the United States Government."**

# පළාත් පාලන ආයතන තුළ
# හඬට ඉඩක් ව්‍යාපෘතිය
# ක්‍රියාත්මක කිරීම සඳහා වූ
# මාර්ගෝපදේශ සංග්‍රහය

**HELP-O Sri Lanka**

ආචාර්ය ඒ.එල්.ඒ. අසෝක සිරිවර්ධන
හඬට ඉඩක් ව්‍යාපෘතියේ උපදේශක
විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම්





# පටුන


පෙරවදන ........................................ V

හෙල්ප්-ඕ ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි තුමාගේ පණිවුඩය ........................................ VI

හෙල්ප්-ඕ ආයතනය  මගින් ක්‍රියාත්මක හඬට ඉඩක් ව්‍යාපෘතියේ පළමු අදියර ........................................ 1

හඬට ඉඩක් ව්‍යාපෘතියේ පළමු අදියර ආරම්භ කිරීමේ පසුබිම හා අරමුණු ........................................ 1

හඬට ඉඩක් ව්‍යාපෘතියේ පළමු අදියරේ ප්‍රතිලාභ ........................................ 1

හඬට ඉඩක් ව්‍යාපෘතියේ දෙවන අදියර ආරම්භ කිරීමේ පසුබිම හා අරමුණු ........................................ 2

හඬට ඉඩක් ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා මූල්‍ය දායකත්වය........................................ 3

HELP-O ආයතනය විසින් හඬට ඉඩක් ව්‍යාපෘතියේ දෙවන අදියරේ අරමුණු ඉටු කර ගැනීම සඳහා භාවිතා කරනු ලබන ප්‍රධාන ප්‍රවේශයන්........................................ 3

හඬට ඉඩක් ප්‍රජා මූල සංවිධාන සංසද පිහිටු වීම ........................................ 3

හඬට ඉඩක් ප්‍රජා විමර්ශකයින්ගේ සංසද පිහිටු වීම ........................................ 4

ප්‍රජා විමර්ශකයින් තෝරා ගැනීමේ ක්‍රමවේදය ........................................ 5

ඊ-සභා ජංගම දුරකථන යෙදවුම හඳුන්වා දීම හා එහි ක්‍රියාකාරීත්වය........................................ 8

ඊ-සභා ජංගම දුරකථන යෙදවුම හඳුන්වා දීම........................................ 8

ඊ-සභා ජංගම දුරකථන යෙදවුමේ ප්‍රතිලාභ ........................................ 8

පළාත් පාලන ආයතනවලට ලැබෙන ප්‍රතිලාභ........................................ 8

සාමාන්‍ය ජනතාවට ලැබෙන ප්‍රතිලාභ........................................ 9

පළාත් පාලන ආයතනවල සභිකයින්ට (මන්ත්‍රී තුමන්) ලැබෙන ප්‍රතිලාභ........................................ 10

ස්මාර්ට් සිටි සංකල්පය හා e-Sabha ජංගම යෙදවුම........................................ 11

ඩිජිටල් පරිවර්තනය හා e-Sabha ජංගම යෙදවුම ........................................ 12

පළාත් පාලනයේ දී ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීමේ වාසි ........................................ 12

පළාත් පාලනයේ දී ඩිජිටල් කරණය ක්‍රියාත්මක කිරීම පසුබෑමකට ලක් වීමට හේතු ........................................ 12

ඊ-සභා ජංගම යෙදවුම බා ගත කිරීමේ පියවරයන් ........................................ 12

ඊ-සභා ජංගම යෙදවුමේ අඩංගු පැමිණිලි කළ හැකි ක්ෂේත්‍ර........................................ 13

ඊ-සභා ජංගම යෙදවුමෙන් ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන ක්‍රියා කළ යුතු ආකාරය ........................................ 14

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත නීතිය තුළ අතුරු ව්‍යවස්ථා සම්පාදනයේ වැදගත්කම........................................ 16

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත නීතිය ........................................ 16

අතුරු ව්‍යවස්ථා සම්පාදනයේ වැදගත්කම........................................ 16








අතුරු ව්‍යවස්ථා සම්පාදනය සඳහා මූලික නීතියේ දක්වා ඇති ප්‍රතිපාදන ............................... 18

අතුරු ව්‍යවස්ථා සම්පාදනය කළ හැකි විෂය ක්ෂේත්‍ර........................................................... 18

අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීමේ දී එහි වලංගුභාවය සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිය යුතු කරුණු ................................................................................................................ 18

අතුරු නීති කඩ කිරීම් සම්බන්ධයෙන් ඇති ප්‍රතිපාදන.................................................. 19

පළාත් පාලනයට අදාළ ප්‍රධාන නීති, රීති රෙගුලාසි සහ නියෝගයන්ට අමතරව ඍජුව හා වක්‍රව බලපෑමක් ඇති වෙනත් නීති.................................................................................................. 19

පළාත් පාලනයට අදාළ වන පූර්වාදර්ශ නඩු තීන්දු.............................................................. 19

ශ්‍රී ලංකාවේ පළාත් පාලන පද්ධතියේ ආරම්භය හා විකාශය............................................. 21

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ඉතිහාසය........................................................................... 21

ශ්‍රී ලංකාවේ නූතන පළාත් පාලන ඉතිහාසය........................................................... 21

පළාත් පාලනයේ පෙරළියක් ඇති කළ ඩොනමෝර් කොමිෂන් සභා නිර්දේශවල ප්‍රතිඵල.......... 22

ශ්‍රී ලංකාවේ නූතන පළාත් පාලනයේ ආරම්භය...................................................................... 22

ලංකාවේ පළාත් පාලන ආයතන ව්‍යුහය සැකසීමේ ප්‍රධාන නිර්ණායක.................................... 22

ප්‍රාදේශීය සභාවල ආරම්භය........................................................................................ 22

2024 දී ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන ව්‍යුහය හා සංඛ්‍යාව................................. 23

පළාත් පාලන ආයතනවලට අයත් මූලික කර්තව්‍යයන්.................................................. 24

පළාත් පාලන ආයතනවල සංයුතිය........................................................................... 24

සභිකයින්ගේ ධුර කාලය................................................................................................ 24

සභිකවරුන් අසුන් ගත යුතු පිළිවෙළ............................................................................. 25

පළාත් පාලනය සම්බන්ධයෙන් පළාත් සභාවට පැවරෙන බලතල................................ 25

වර්තමානයේ පළාත් පාලන ආයතන මුහුණ දී ඇති ගැටලු......................................... 25

වර්තමානයේ පළාත් පාලන ආයතන මුහුණ දී ඇති ගැටලු අවම කර ගැනීම සඳහා යෝජිත උපාය මාර්ග........................................................................................................................ 26

පළාත් පාලනයේ දී සක්‍රිය පුරවැසි සහභාගීත්වය...................................................... 28

පුරවැසි සහභාගීත්වය යනු කුමක් ද?............................................................................ 28

පුරවැසි සහභාගීත්වයේ ප්‍රතිලාභ.................................................................................. 28

පුරවැසි සහභාගීත්වය ලබා ගැනීම සඳහා පළාත් පාලන ආයතනයකට අනුගමනය කළ හැකි උපාය මාර්ග........................................................................................................................ 29

මහා නගර සභා ආඥා පනත හා අතුරු ව්‍යවස්ථාවන්ට අනුව කමිටු පිහිටුවීමට ඇති බලතල 30

නගර සභා ආඥා පනත හා අතුරු ව්‍යවස්ථාවන්ට අනුව කමිටු පිහිටුවීමට ඇති බලතල......... 31

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත හා අතුරු ව්‍යවස්ථාවන්ට අනුව කමිටු පිහිටු වීමට ඇති බලතල.................... 32

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ පූර්විකාව.................... 32

පළාත් පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මඟින් 2012-2014 පුරවැසියාට පවරා දී ඇති අයිතිවාසිකම්.................... 32

ව්‍යවස්ථාපිත නීති මගින් පළාත් පාලනයේ දී පුරවැසියාට පවරා දී ඇති අයිතිවාසිකම්.................... 32

හඬට ඉඩක් ව්‍යාපෘතිය යටතේ පළාත් පාලනයේ දී මහජන සහභාගීත්වය ලබා ගැනීම සඳහා ප්‍රජාව සවිබල ගැන්වීමේ උපාය මාර්ග.................... 33

හඬට ඉඩක් ව්‍යාපෘතිය යටතේ පළාත් පාලනයේ දී මහජන සහභාගීත්වය ලබා ගැනීම සඳහා පළාත් පාලන ප්‍රධානීන් සවිබල ගැන්වීමේ උපාය මාර්ග .................... 33

පළාත් පාලනයේ දී සක්‍රිය පුරවැසි සහභාගීත්වය ලබා ගැනීම සඳහා ප්‍රජා මණ්ඩල හා ප්‍රජා සංවර්ධන සමිති සවිබල ගැන්වීමේ උපාය මාර්ග හා එහි ප්‍රතිලාභ.................... 35

ප්‍රජා මණ්ඩල/ ප්‍රජා සංවර්ධන සමිති පිහිටුවීම පිළිබඳ ඓතිහාසික පසුබිම.................... 35

ප්‍රජා මණ්ඩල පිහිටු වීමට අදාළ නිර්නායක .................... 36

එම උපදෙස් අනුව ප්‍රජා මණ්ඩලයකින් අපේක්ෂිත කාර්යභාරය.................... 37

ප්‍රජා මණ්ඩල පිහිටුවීමෙහි පරමාර්ථය.................... 37

ප්‍රජා මණ්ඩල පිහිටුවීමෙහි අරමුණු.................... 37

ප්‍රාදේශීය ප්‍රජා බල මණ්ඩලය.................... 38

මේ ලේඛනය සැකසීම සඳහා පරිශීලනය කළ ග්‍රන්ථ හා ලේඛන.................... 39





# පෙරවදන

පුද්ගලයකුගේ පිළිසිඳ ගැනීමේ සිට සුසාන භූමිය දක්වා වූ කාල පරාසය තුළ ජීවත් වීමට අදාළ තම දෛනික අවශ්‍යතා සපුරා ගැනීමේ ක්‍රියාවලියේ දී පුරවැසියන් සහ පළාත් පාලන ආයතන අතර පවතින්නේ අවියෝජනීය සබඳතාවකි. එහෙත් ඒ බැව් මේ දෙපාර්ශ්වය ම නිසි ලෙස වටහා ගෙන නො මැති බැව් හෙල්පෝ ආයතනය විසින් දකුණු පළාතේ පළාත් පාලන ආයතන දහයක් ඇසුරින් කරන ලද සමීක්ෂණයක් මගින් අනාවරණය විය.

HELP-O ආයතනය විසින් හඬට ඉඩක් ව්‍යාපෘතිය දකුණු පළාතට හඳුන්වා දෙනු ලබන්නේ පුරවැසියන් සහ පළාත් පාලන ආයතන අතර පවත්නා මෙම දුරස්ථ භාවය අවම කර අන්‍යෝන්‍ය විශ්වාසය හා සුහද බව වර්ධනය කිරීමේ අරමුණෙනි.

මෙම දෙපාර්ශ්වය අතර සබඳතාව ශක්තිමත් වීම මේ රටේ ආර්ථික, සාමාජික, සංස්කෘතික හා දේශපාලන ක්ෂේත්‍රයේ සුවිශේෂී වෙනසකට මුල පිරීමක් වනු ඇත.

පළාත් පාලන ආයතන වඩ වඩාත් පුරවැසියන්ට සමීප විය යුතු ය. ඒ සඳහා උණුසුම් පිළිගැනීම හා ප්‍රමාදයකින් තොර ව සේවා සැපයීම වැනි ආචාර ධර්ම පද්ධතියක් පවත්වා ගෙන යා යුතු ය. සංවර්ධන ක්‍රියාවලියේ දී හා අයවැය සැකසීමේ දී මහජන සහභාගීත්වයට මුල් තැන දිය යුතු ය. මහජනතාවට තම සේවා ප්‍රමාදයකින් තොර ව ලබා ගැනීම සඳහා මාර්ග ගත සේවා හඳුන්වා දිය යුතු ය.

පළාත් පාලන ක්ෂේත්‍රයේ දීර්ඝ කාලීන තම අත් දැකීම් සමුදාය ඇසුරින් චතුර වැලිවිටිය මහතා ඊ සභා ජංගම දුරකථන යෙදවුම හඳුන්වා දෙන ලද්දේ මෙම හිදැස පිරවීමේ ආරම්භක පියවරක් ලෙසිනි.

හඬට ඉඩක් ව්‍යාපෘතියේ අරමුණු පැහැදිලි කර දීම සඳහාත්, ඊ සභා ජංගම දුරකථන යෙදවුම භාවිතයට අදාළ ව පුරවැසියන්ගේ සහ පළාත් පාලන ආයතනවල වගකීම සහ එහි ප්‍රතිලාභ පැහැදිලි කර දීම සඳහාත්, අත් පොතක් සැකසීමේ අවශ්‍යතාව දැඩිව දැනුණු බැවින් එය සැකසීමේ වගකීම චතුර වැලිවිටිය මහතා විසින් මා වෙත පවරන ලදී. මේ එම උත්සාහයේ අවසන් නිමැවුම යි.

එමෙන් ම පළාත් පාලන ක්ෂේත්‍රයේ නිලධාරීන්ට ද මෙම අත් පොත ප්‍රයෝජන වත් වනු පිණිස පළාත් පාලන ඉතිහාසය ඇතුළු අතිරේක තොරතුරු රැසක් චතුර වැලිවිටිය මහතාගේ උපදෙස් පරිදි මෙම අත් පොතට එකතු කළෙමි.

මෙම කෘතිය සැකසීමේ දී ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියකු ලෙස මා ලද අත්දැකීම් සහ ගාල්ල නාගරික කොමසාරිස්වරයා ලෙස මා ලද අත්දැකීම් ද, කොළඹ විශ්ව විද්‍යාලය මගින් පවත්නු ලැබූ පළාත් පාලනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවෙන් (DDLG) මා ලද දැනුම ද, පළාත් පාලනය පිළිබඳ දේශීය හා විදේශීය පුහුණු පාඨමාලාවලින් මා ලද දැනුම ද බෙහෙවින් ප්‍රයෝජන වත් විණි.

ආරම්භයේ සිට ම මෙම කෘතියේ ගුණදොස් පෙන්වා දෙමින් මා දිරිමත් කළ හෙල්පෝ ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී චතුර වැලිවිටිය මහතා, තිරසාර සංවර්ධන සභාවේ සහකාර අධ්‍යක්ෂිකා නදීකා අමරසිංහ මෙනෙවිය, හඬට ඉඩක් ව්‍යාපෘති කළමනාකරු ලහිරු මධුරංග මහතා, ආසියා පදනමේ, ප්‍රජා සංවිධාන බල ගැන්වීමේ වැඩසටහනේ, වැඩසටහන් කළමනාකරු, මොහොමඩ් සියාඩ් මහතා සහ ව්‍යාපෘතිය සඳහා මූල්‍යාධාර සැපයූ ආසියා පදනම (The Asia Foundation) ද කෘතවේදී ව සිහිපත් කරමි. එමෙන් ම යම් ගැටලු සහගත තැන් නිරාකරණය කර ගැනීම සඳහා, පළාත් පාලනය පිළිබඳ ප්‍රාමාණික විද්වතකු වූ, පළාත් පාලන අමාත්‍යාංශයේ විශ්‍රාමික අතිරේක ලේකම් ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මහතාගෙන් ලද සහාය ද නිහතමානී ව අගය කරමි.

ආචාර්ය ඒ.එල්.ඒ. අසෝක සිරිවර්ධන (BA, MA, PhD)
හඬට ඉඩක් ව්‍යාපෘතියේ උපදේශක, විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම්







# හෙල්ප්-ඕ ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි තුමාගේ පණිවුඩය

දකුණු පළාතේ තිරසාර සංවර්ධනය අරමුණු කර ගත්, සියලු දෙනා ඇතුළත් වූ තීරණ ගැනීමේ හා සැලසුම් කිරීමේ ක්‍රියාවලිය සඳහා පළාත් පාලන ආයතන, රාජ්‍ය නොවන සංවිධාන හා රාජ්‍ය ආයතන අතර සහභාගීත්වය හා සහයෝගීත්වය ඇති කිරීම සඳහා ශක්තිමත් හා තිරසාරභාවයෙන් යුතු පදනමක් ගොඩනැගීම, හඬට ඉඩක් ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ මූලික අභිප්‍රාය විය.

ගාල්ල දිස්ත්‍රික්කයෙන් අරඹන ලද, මෙම ජනතා වැඩසටහන ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා ඉදිරියේ දී විශාල දායකත්වයක් සපයනු ඇති බව ව්‍යාපෘතිය සඳහා මූල්‍යාධාර සැපයූ ආසියානු පදනම (The Asia Foundation) සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන හෙල්ප්- ඕ (HELP-O) සංවිධානය අපේක්ෂා කරති. දකුණු පළාත් පාලන දෙපාර්තමේන්තුව හා එක් ව ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය සඳහා, දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය, දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය හා ගාල්ල දිස්ත්‍රික් රාජ්‍ය නොවන සංවිධාන එකතුව කටයුතු කරනු ලබති.

විශේෂයෙන් ම මෙම වටිනා මාර්ගෝපදේශ සංග්‍රහය සම්පාදනය කරන ලද, ව්‍යාපෘති උපදේශක ආචාර්ය අසෝක සිරිවර්ධන මහතාට සහ ඊට සහාය ලබා දුන් තිරසාර සංවර්ධන සභාවේ සහකාර අධ්‍යක්ෂිකා නදීකා අමරසිංහ මෙනෙවියටත්, හඬට ඉඩක් ව්‍යාපෘති අධ්‍යක්ෂ ලහිරු මධුරංග මහතාටත්, ආසියා පදනමේ, ප්‍රජා සංවිධාන බල ගැන්වීමේ වැඩසටහනේ, වැඩසටහන් කළමනාකරු, මොහොමඩ් සියාඩ් මහතාටත් ස්තූති කළ යුතු ය.

මෙම ව්‍යාපෘතිය පළමු වන අදියර ක්‍රියාත්මක කිරීමේ දී බොහෝ දෙනෙකුගේ සහාය ලැබුණු බව සිහිපත් කරමි. විශේෂයෙන් පලාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් ක්‍රිශාන්ත මහේන්ද්‍ර මයා හා එවකට හිටපු පලාත් පාලන කොමසාරිස් සේනක පල්ලියගුරුගේ මහතා, හිටපු පලාත් පාලන කොමසාරිස් රනිල් වික්‍රමසේකර මහතා සහ පලාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබුණු සහාය අගය කරමි.

එමෙන්ම ගාල්ල මහා නගර සභාවේ හිටපු නගරාධිපති තුමා, හිටපු නියෝජ්‍ය නගරාධිපති තුමා, ඇතුළු මුල් අදියරේ පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්, මන්ත්‍රීවරුන් සහ නිලධාරීන්ගේ දායකත්වය ද, ගාල්ල හිටපු දිස්ත්‍රික් ලේකම් ශාන්ත වීරසිංහ මහතා සහ ප්‍රාදේශීය ලේකම්තුමන්ලා ඇතුළු රාජ්‍ය නිලධාරීන්ගේ දායකත්වය ද, අගැයීමට මම කැමැත්තෙමි

ව්‍යාපෘතියේ අරමුණු සහ වැඩසටහන් පිළිබඳ මෙම අත්පොත මගින් ඔබ දැනුවත් කරනු ලබන අතර දකුණු පළාතේ, සමාජ, පාරිසරික, ආර්ථික, තිරසාර සංවර්ධනය උදෙසා වගකිවයුතු පුද්ගලයකු ලෙස ඔබට අප හා සම්බන්ධ වීමට ආරාධනා කරමු.

චතුර වැලිවිටිය

ප්‍රධාන විධායක නිලධාරි හෙල්ප්-ඕ ආයතනය

## HELP-O ආයතනය මගින් ක්‍රියාත්මක හඬට ඉඩක් ව්‍යාපෘතියේ පළමු අදියර

### හඬට ඉඩක් ව්‍යාපෘතියේ පළමු අදියර ආරම්භ කිරීමේ පසුබිම හා අරමුණු

පළාත් පාලන ආයතන මගින් ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් සැකසීමේ දී තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඵලදායී ලෙස සහභාගි වීමට ජනතාවට වැඩි අවස්ථාවන් සලසා දීම, පළාත් පාලන ආයතන මහජනතාවට සමීප ස්ථාන බවට පත් කිරීම, හා ප්‍රාදේශීය සැලසුම් කරණයේ දී කාන්තා සහභාගීත්වයට වැඩි ඉඩකඩක් ලබා දීම යන කරුණු රැසක් මුල් කර ගෙන හඬට ඉඩක් ව්‍යාපෘතියේ පළමු අදියර ආරම්භ කරන ලදී.

පුරවැසියන් සහ තීරණ ගන්නන් අතර ඇති පරතරය අවම කිරීමට සහ ඔවුන්ගේ හඬ මතු කර ගැනීමට වඩා හොඳ අවස්ථාවන් මෙම ව්‍යාපෘතිය මගින් ඇති කරන ලදී. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පළාත් පාලන ආයතන හා ඊට සම්බන්ධ සියලු ම පාර්ශ්වකාර ආයතනයන් (විදුලිබල මණ්ඩලය, ජල සම්පාදන මණ්ඩලය හා ටෙලිකොම් ආයතනය වැනි) සම්බන්ධ කර ගන්නා ලදී.

හඬට ඉඩක් ව්‍යාපෘතියේ පළමු අදියර, ගාල්ල දිස්ත්‍රික්කය තුළ පළාත් පාලන ආයතන 10ක ආරම්භ කරන ලදී. (ගාල්ල මහා නගර සභාව, හික්කඩුව නගර සභාව, රත්ගම, බෝපේ පෝද්දල බද්දේගම, වැලිවිටිය දිවිතුර, නාගොඩ, අක්මීමන, යක්කලමුල්ල, සහ හබරාදුව යන ප්‍රාදේශීය සභා)

HELP-O ආයතනය විසින් හඬට ඉඩක් ව්‍යාපෘතියේ පළමු අදියර අරමුණු ඉටු කර ගැනීම සඳහා ප්‍රජා මූල සංවිධාන ගොඩ නැගීම, ප්‍රජා නිරීක්ෂක කණ්ඩායම් ගොඩ ගැනීම (Community Watch Dogs), e-Sabha යෙදවුම ප්‍රචලිත කිරීම, ඒකාබද්ධ සංවර්ධන සැලසුම් සැකසීම සහ හඬට ඉඩක් රේඩියෝ වැඩසටහන යන ප්‍රධාන ප්‍රවේශයන් භාවිතා කරන ලදී.

### හඬට ඉඩක් ව්‍යාපෘතියේ පළමු අදියරේ ප්‍රතිලාභ

මෙම ව්‍යාපෘතිය හරහා ගොඩනැගුණු ප්‍රජා නිරීක්ෂකයින්ගේ සංසද (Community Watchdog Forums) තවදුරටත් සමාජය තුළ ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරමින් නිවැරදි ස්ථානවල ඔවුන්ගේ හඬ නගමින් අවශ්‍ය සියලු තොරතුරුප්‍රජාව සමග බෙදා ගැනීමට කටයුතු කරන ලදී. මේ නිසා ප්‍රාදේශීය සැලසුම් කරණයේ දී ජනතා සහභාගීත්වයට වැඩි අවස්ථාවන් ලැබීම හා විශේෂයෙන් කාන්තා සහභාගීත්වයට වැඩි අවස්ථාවන් ලැබීම ව්‍යාපෘතිය තුළින් ලද සුවිශේෂී ජයග්‍රහණයන් ලෙස පෙන්වා දිය හැකි ය..

e-Sabha ජංගම යෙදවුම පළාත් පාලන ආයතන සහ එහි ප්‍රජාව සම්බන්ධ කරන වඩාත් ම උපාය මාර්ගික මෙවලම බවට පත් වූ අතර පළාත් පාලන ප්‍රජාවට තමන්ගේ වටිනා කාලය හා සම්පත් අපතේ නො යවා ඔවුන්ගේ පැමිණිලි පළාත් පාලන ආයතනය වෙත යොමු කිරීමට මේ යෙදවුම මගින් අවස්ථාව උදා විය.

මෙම යෙදවුම නිසා මන්ත්‍රීවරුන්ට සහ නිලධාරීන්ට ලැබෙන පැමිණිලි පහසුවෙන් නිරීක්ෂණය කළ හැකි වීම නිසා වැඩි කාලයක් ගත නො කර ජනතාවගේ පැමිණිලිවලට ප්‍රතිචාර දැක්විය හැකි විය.

එමගින් පළාත් පාලන ආයතනවලින් සිදු කෙරෙන සේවයන් කෙරෙහි මෙන් ම පළාත් පාලන නියෝජිතයින් සහ නිලධාරීන් කෙරෙහි දක්වන විශ්වාසය ද වැඩි වූ අතර එය සම්පත් නාස්තිය, දූෂණය සහ අල්ලස සැලකිය යුතු ලෙස අඩු කිරීමට ද දායක විය.

කිසි දිනක අක්‍රිය වීථි පහනක් දැක සභාවට පැමිණිලි නො කළ තරුණ පරම්පරාව e-Sabha ජංගම යෙදවුම භාවිත කරමින් සභාවට තම පැමිණිලි ඉදිරි පත් කිරීමට උනන්දු වීම ව්‍යාපෘතිය ලැබූ තවත් අනපේක්ෂිත ජයග්‍රහණයක් විය.

ව්‍යාපෘතියේ සාර්ථකත්වය, ජනතා පිළිගැනීම සහ අනෙකුත් පළාත් පාලන ආයතනවල ඉල්ලීම් මත පදනම් ව, නියමු වැඩසටහන් ලෙස ගාල්ල දිස්ත්‍රික්කයේ ඉතිරි පළාත් පාලන ආයතන 10 සහ දකුණු පළාතේ අනෙකුත් දිස්ත්‍රික්ක දෙකෙහි පළාත් පාලන ආයතන 10ක් වෙතට ද මෙම ව්‍යාපෘතිය ව්‍යාප්ත කිරීමට හැකි විය.

## හඬට ඉඩක් ව්‍යාපෘතියේ දෙවන අදියර ආරම්භ කිරීමේ පසුබිම හා අරමුණු

හඬට ඉඩක් ව්‍යාපෘතියේ පළමු අදියර සාර්ථකත්වය හා ජනතා පිළිගැනීම නිසා පළාත් පාලන ආයතන රැසකින් මෙම ව්‍යාපෘතිය තම ආයතන වලට ද ලබා දෙන ලෙසට කරනු ලැබූ ඉල්ලීම් මත පදනම් ව හඬට ඉඩක් ව්‍යාපෘතියේ දෙවන අදියර ආරම්භ කරන ලදී.

මේ සඳහා ගාල්ල දිස්ත්‍රික්කයේ ඉතිරි පළාත් පාලන ආයතන දහය ද (අම්බලන්ගොඩ නගර සභාව, අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව, බෙන්තොට ප්‍රාදේශීය සභාව, බලපිටිය ප්‍රාදේශීය සභාව, කරන්දෙණිය ප්‍රාදේශීය සභාව, ඇල්පිටිය ප්‍රාදේශීය සභාව, නියාගම ප්‍රාදේශීය සභාව, නෙළුව ප්‍රාදේශීය සභාව,තවලම ප්‍රාදේශීය සභාව සහ ඉමදූව ප්‍රාදේශීය සභාව), මාතර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 05ක් ද (මාතර මහා නගර සභාව, මාතර ප්‍රාදේශීය සභාව, වැලිගම නගර සභාව, වැලිගම ප්‍රාදේශීය සභාව සහ අකුරැස්ස ප්‍රාදේශීය සභාව), හම්බන්තොට දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 05ක් ද (හම්බන්තොට මහා නගර සභාව, තංගල්ල නගර සභාව, තංගල්ල ප්‍රාදේශීය සභාව, බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව සහ කටුවන ප්‍රාදේශීය සභාව) පළාත් පාලන කොමසාරිස් තුමාගේ එකඟතාව මත ව්‍යාපෘති නිර්ණායකයන්ට යටත් ව තෝරා ගන්නා ලදී.

## හඬට ඉඩක් ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා මූල්‍ය දායකත්වය

හඬට ඉඩක් ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා මූල්‍ය දායකත්වය ආයතන කීපයක් එකතුව සිදු කරනු ලැබේ.
United States Agency for International Development (USAID) ආයතනය විසින් Bolstering Civil Society (BCS) වැඩසටහන යටතේ ලබා දුන් මූල්‍ය ආධාර සමග, Civil Society and Media - Strengthened Together and Advancing in New Directions (CSM-STAND) ආයතනය, The Asia Foundation ආයතනය සහ Pact Inc. ආයතනයේ ද සහයෝගය ඇතිව හඬට ඉඩක් ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා දායකත්වය සපයන ලදී.

## HELP-O ආයතනය විසින් හඬට ඉඩක් ව්‍යාපෘතියේ දෙවන අදියරේ අරමුණු ඉටු කර ගැනීම සඳහා භාවිතා කරනු ලබන ප්‍රධාන ප්‍රවේශයන්

1. පළාත් පාලන මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින් සහ පළාත් මට්ටමින් හඬට ඉඩක් ප්‍රජා මූල සංවිධාන 1000ක ගෙන් සමන්විත ප්‍රජා මූල සංවිධාන සංසද 24ක් ජාල ගත කිරීම.
2. පළාත් පාලන මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින් සහ පළාත් මට්ටමින් ප්‍රජා විමර්ශකයින් 200ක ගෙන් සමන්විත සංවිධාන සංසද 24ක් ජාල ගත කිරීම (Community Watchdog Forums)
3. e-Sabha යෙදවුම හඳුන්වා දීම හා ප්‍රචලිත කිරීම
4. e-Sabha යෙදවුම හඳුන්වා දීම හා ප්‍රචලිත කිරීම සඳහා රූපවාහිනී වැඩසටහන් හා සමාජ මාධ්‍ය භාවිතා කිරීම.
5. සම්මත අතුරු ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම
6. පළාත් පාලනයේ දී මහජන සහභාගීත්වය ලබා ගැනීම සඳහා පළාත් පාලන ප්‍රධානීන් සහ ප්‍රජාව සවිබල ගැන්වීම

## හඬට ඉඩක් ප්‍රජා මූල සංවිධාන සංසද පිහිටු වීම

**හඬට ඉඩක් ප්‍රජා මූල සංවිධාන සංසද පිහිටු වීම අදියර 03ක් යටතේ සිදු කරනු ලබයි:**

1. පළාත් පාලන ආයතන මට්ටමින් ප්‍රජා මූල සංවිධාන සංසද 20ක් පිහිටුවා ජාල ගත කිරීම.
2. දිස්ත්‍රික් මට්ටමින් ප්‍රජා මූල සංවිධාන සංසද 03ක් පිහිටුවා ජාල ගත කිරීම.
3. පළාත් මට්ටමින් ප්‍රජා මූල සංවිධාන සංසදයක් පිහිටු වීම

**01. පළාත් පාලන ආයතන මට්ටමින් ප්‍රජා මූල සංවිධාන සංසද 20ක් පිහිටුවා ජාල ගත කිරීමේ පියවරයන්:**

1. එක් පාලන ආයතන බල ප්‍රදේශයකින් ක්‍රියාකාරී ස්වේච්ඡා සංවිධාන 50කින් නියෝජිතයින් 50ක් තෝරා ගෙන ප්‍රජා මූල සංවිධාන සංසදයක් පිහිටු වීම.
2. ඒ අනුව පළාත් පාලන ආයතන බල ප්‍රදේශ 20ක් සඳහා ප්‍රජා මූල සංවිධාන සංසද 20ක් පිහිටු වීම.
3. ඒ අනුව ක්‍රියාකාරී ස්වේච්ඡා සංවිධාන 1,000ක් ජාල ගත කිරීම.

**02. දිස්ත්‍රික් මට්ටමින් හඬට ඉඩක් ප්‍රජා මූල සංවිධාන සංසද 03ක් පිහිටුවා ජාල ගත කිරීමේ පියවරයන්**

1. ගාල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ප්‍රජා මූල සංවිධාන සංසදයේ එකතුවෙන් ගාල්ල දිස්ත්‍රික් සංසදය පිහිටු වීම.
2. මාතර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ප්‍රජා මූල සංවිධාන සංසදහේ එකතුවෙන් මාතර දිස්ත්‍රික් සංසදය පිහිටු වීම.
3. හම්බන්තොට දිස්ත්‍රික්කයේ පළාත්පාලන ප්‍රජා මූල සංවිධාන සංසදහේ එකතුවෙන් හම්බන්තොට දිස්ත්‍රික් සංසදය පිහිටු වීම.

**03. හඬට ඉඩක් දකුණු පළාත් ප්‍රජා මූල සංවිධාන සංසදය පිහිටු වීමේ පියවරයන්**

1. ගාල්ල දිස්ත්‍රික් ප්‍රජා මූල සංවිධාන සංසදය,
2. මාතර දිස්ත්‍රික් ප්‍රජා මූල සංවිධාන සංසදය හා
3. හම්බන්තොට දිස්ත්‍රික් ප්‍රජා මූල සංවිධාන සංසදය යන සංසද තුන එක් වී දකුණු පළාත් ප්‍රජා මූල සංවිධාන සංසදය පිහිටු වීම.

## හඬට ඉඩක් ප්‍රජා මූල සංවිධාන බල ගැන්වීමේ උපාය මාර්ග

1. පළාත් පාලන ප්‍රජා මූල සංවිධාන සංසද 20ක් පිහිටු වීම සඳහා එම පළාත් පාලන ආයතන 20හි කුඩා රැස්වීම් 20ක් (pocket meetings) පැවැත්වීම.
2. එලෙස පිහිටුවා ගත් ප්‍රජා මූල සංවිධාන සංසද 20හි සාමාජිකයින් සඳහා පුහුණු වැඩසටහන් 20ක් පැවැත්වීම. (පළාත් පාලන නීතිය, ප්‍රජා සහභාගීත්ව සැලසුම් කරණය සහ ප්‍රජා සහභාගීත්ව අයවැය කරණය යන විෂයන් ද ආවරණය වන පරිදි ).
3. හඬට ඉඩක් වැඩසටහන පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සඳහා මාර්ගෝපදේශ පොත් 2,000ක් නිකුත් කිරීම
4. දිස්ත්‍රික් මට්ටමේ සහ පළාත් මට්ටමේ ප්‍රජා මූල සංවිධාන සංසද ජාල ගත කිරීම සඳහා වැඩමුළු 04ක් පැවැත්වීම.

## හඬට ඉඩක් ප්‍රජා විමර්ශකයින්ගේ සංසද පිහිටු වීම

**හඬට ඉඩක් ප්‍රජා විමර්ශකයින්ගේ සංසද පිහිටු වීම අදියර 03ක් යටතේ සිදු කෙරේ**

1. පළාත් පාලන ආයතන මට්ටමින් ප්‍රජා විමර්ශකයින්ගේ සංසද 20ක් පිහිටුවා ජාල ගත කිරීම.
2. දිස්ත්‍රික් මට්ටමින් ප්‍රජා විමර්ශකයින්ගේ සංසද 03ක් පිහිටු වීම.
3. පළාත් මට්ටමින් ප්‍රජා විමර්ශකයින්ගේ සංසදයක් පිහිටු වීම.

**පළාත් පාලන ආයතන මට්ටමින් ප්‍රජා විමර්ශකයින්ගේ සංසද 20ක් පිහිටුවා ජාල ගත කිරීමේ පියවරයන්:**

1. එක් පාලන ආයතන බල ප්‍රදේශයකින් ක්‍රියාකාරී ස්වේච්ඡා සංවිධාන 50කින් නියෝජිතයින් 10ක් තෝරා ගෙන ප්‍රජා විමර්ශකයින්ගේ සංසදයක් පිහිටු වීම.
2. ඒ අනුව පළාත් පාලන ආයතන බල ප්‍රදේශ20ක් සඳහා ප්‍රජා විමර්ශකයින්ගේ සංසද 20ක් පිහිටු වීම.

**දිස්ත්‍රික් මට්ටමින් ප්‍රජා විමර්ශකයන්ගේ සමූහ 03ක් පිහිටුවා ජාල ගත කිරීමේ පියවරයන්...**

1. ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රජා විමර්ශකයන්ගේ සමූහයේ එකතුවෙන් ගාල්ල දිස්ත්‍රික් සංසදය පිහිටුවීම.
2. මාතර දිස්ත්‍රික්කයේ ප්‍රජා විමර්ශකයන්ගේ සමූහ පහේ එකතුවෙන් මාතර දිස්ත්‍රික් සංසදය පිහිටු වීම.
3. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රජා විමර්ශකයන්ගේ සමූහ පහේ එකතුවෙන් හම්බන්තොට දිස්ත්‍රික් සංසදය පිහිටු වීම.
4. එලෙස දිස්ත්‍රික් ප්‍රජා විමර්ශකයින්ගේ සමූහ තුනක් පිහිටු වීම.

**දකුණු පළාත මට්ටමින් ප්‍රජා විමර්ශකයින්ගේ සමූහය පිහිටුවා ජාල ගත කරිමේ පියවරයන්**

1. ගාල්ල දිස්ත්‍රික් ප්‍රජා විමර්ශකයින්ගේ සමූහය
2. මාතර දිස්ත්‍රික් ප්‍රජා විමර්ශකයින්ගේ සමූහය
3. හම්බන්තොට දිස්ත්‍රික් ප්‍රජා විමර්ශකයින්ගේ සංසදය යන සමූහ 03 එක් වී දකුණු පළාත් ප්‍රජා විමර්ශකයින්ගේ සමූහය පිහිටු වීම.

## ප්‍රජා විමර්ශකයින් තෝරා ගැනීමේ ක්‍රමවේදය

ප්‍රාදේශීය සැලසුම් කරණයේ දී පුරවැසියන් සහ තීරණ ගන්නන් අතර ඇති පරතරය අවම කිරීම සඳහා පළාත් පාලන ආයතන සහ ප්‍රජා මූල සංවිධාන එකට සම්බන්ධ කිරීමේ උපාය මාර්ගයක් ලෙස හඬට ඉඩක් ව්‍යාපෘතිය පළමු අදියරේ දී ප්‍රජා විමර්ශක තනතුර හඳුන්වා දෙනු ලදී. රජය විසින් රාජ්‍ය නොවන සංවිධානයක සහයෝගයෙන් පළාත් පාලන ආයතන සහ ප්‍රජා මූල සංවිධාන අතර සම්බන්ධතාව පවත්වා ගැනීම සඳහා පළමු වරට ඇති කළ සජීවී කාරක තනතුරක් ලෙස ප්‍රජා විමර්ශක තනතුර හැඳින්විය හැකි ය.

හඬට ඉඩක් ව්‍යාපෘතියේ පළමු රැස්වීම් මාලාවේ දී පළාත් පාලන ආයතන මට්ටමේ ප්‍රජා මූල සංවිධාන සංසදයකින් ප්‍රජා විමර්ශකයින් දහ දෙනා බැගින් තෝරා ගනු ලබයි. එම ප්‍රජා විමර්ශකයින් දහ දෙනා එකතුව පළාත් පාලන ආයතන මට්ටමින් ප්‍රජා විමර්ශකයින්ගේ සංසදයක් පිහිටුවා ගනු ලබයි. ඒ අනුව පළාත් පාලන ආයතන 20හි ප්‍රජා විමර්ශකයින්ගේ සංසද 20ක් පිහිටුවා ගනු ලබයි.

එලෙස පිහිටු වන ප්‍රජා විමර්ශක සංසද නියෝජිතයින්ගේ එකතුවෙන් දිස්ත්‍රික් ප්‍රජා විමර්ශකයින්ගේ සංසද 03ක් පිහිටුවා ගනු ලබයි. දිස්ත්‍රික් ප්‍රජා විමර්ශක සංසද 03හි නියෝජිතයින්ගේ එකතුවෙන් දකුණු පළාත් ප්‍රජා විමර්ශක සංවිධාන සංසදය පිහිටුවා ගනු ලබන අතර එමගින් ප්‍රජා විමර්ශකයින් 200ක් ජාල ගත කරනු ලබයි.

පළාත් පාලන බලප්‍රදේශය කොටස් 10 කට වෙන් කර ඉන් එක කොටසක හඬට ඉඩක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම පවරනු ලැබේ. සියලු ම ප්‍රාදේශීය ප්‍රජා විමර්ශකයින් පළාත් පාලන කොමසාරිස් දෙපාර්තමේන්තුව යටතේ ලියා පදිංචි කර වීමට හා හැඳුනුම් පත් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

**ප්‍රජා විමර්ශකයින් තෝරා ගැනීමේ දී පහත නිර්ණායකයන් සැලකිල්ලට ගනු ලැබේ**

1. පළාත් පාලන ආයතන මට්ටමේ ප්‍රජා මූල සංවිධාන සංසදයේ ක්‍රියාකාරී සාමාජිකයකු වීම.
2. සමාජශීලී පුද්ගලයකු වීම.
3. ප්‍රාදේශීය පාලනය සඳහා තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී පළාත් පාලන ආයතන සමග ක්‍රියාකාරී ව හා සුහදශීලී ව කටයුතු කළ හැකි අයකු වීම.
4. ඒ සඳහා තම කාලය කැප කළ හැකි අයකු වීම.
5. ඵලදායී සන්නිවේදන කුසලතා වලින් යුක්ත අයකු වීම.
6. පුළුල් සමාජ සම්බන්ධතා ජාලයක් තිබීම.
7. විවිධ ක්ෂේත්‍රයන්හි පැතිරුණු අත්දැකීම් ඇති අයකු වීම.



**ප්‍රජා විමර්ශකයින්ගෙන් අපේක්ෂිත කාර්යභාරය පහත පරිදි වේ**

1. ප්‍රාදේශීය පාලනය සඳහා තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී මහජන සහභාගීත්වය උපරිම වශයෙන් ලබා ගැනීමට මැදිහත් වීම.
2. පළාත් පාලන ආයතනවල මාසික මහා සභා රැස්වීමේ කාරක සභා අවස්ථාවට හා කමිටුවල වලට සහභාගී වී තම බල ප්‍රදේශයේ ජනතාවගේ අදහස් හා ගැටලු ඉදිරි පත් කිරීමට මැදිහත් වීම.
3. පළාත් පාලනයට අදාළ සැලසුම් සකස් කිරීමේ දී හා අයවැය සැකසීමේ දී ඊට දායක වීම
4. කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමට දායක වීම.

5. පළාත් පාලන ආයතනවල වගවීම සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීමට දායක වීම.
6. තමාට වෙන් කර දී ඇති බල ප්‍රදේශය තුළ හඬට ඉඩක් ව්‍යාපෘතියේ අරමුණු ඉටු කිරීමට මැදිහත් වීම.
7. තම බල ප්‍රදේශය තුළ e-Sabha යෙදවුම බා ගත කර වීමට මැදිහත් වීම.
8. තම බල ප්‍රදේශය තුළ e-Sabha යෙදවුම භාවිතය ජන ගත කිරීමට දායක වීම.
9. පුරවැසියන් සමග සාකච්ඡා හා සංවාද කරමින් සංවර්ධනයේ බාධාවන් අවම කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග ඔවුන් තුළින් ම හඳුනා ගැනීමට දායක වීම.

## ප්‍රජා විමර්ශකයින් විසින් වර්ධනය කර ගත යුතු දැනුම, ආකල්ප හා කුසලතා

1. ප්‍රජා විමර්ශකයින්ගේ භූමිකාව හා කාර්යභාරය හඳුනා ගැනීම.
2. නායකත්ව ගුණාංග වර්ධනය කර ගැනීම.
3. නවීන සන්නිවේදන කුසලතා වර්ධනය කර ගැනීම.
4. පළාත් පාලන ආයතනයක කාර්යභාරය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම.
5. පළාත් පාලනයට අදාළ නීති රීති පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම.
6. සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය හා ප්‍රාදේශීය සැලසුම් කරණයේ දී ජනතා සහභාගීත්වය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම.
7. පළාත් පාලනයට අදාළ සැලසුම් සකස් කිරීම හා අයවැය සැකසීම පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම.
8. e-Sabha යෙදවුම ප්‍රචලිත කිරීමේ වැදගත් කම හා උපාය මාර්ග පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම.

## හඬට ඉඩක් ප්‍රජා විමර්ශකයින් බල ගැන්වීම සඳහා ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ක්‍රියා මාර්ග

1. පළාත් පාලන ප්‍රජා විමර්ශකයින්ගේ සංසද 20ක් පිහිටු වීම
2. එලෙස පිහිටුවා ගත් ප්‍රජා විමර්ශකයින් සංසද 20හි සාමාජිකයින් සඳහා පුහුණු වැඩසටහන් 03ක් පැවැත්වීම.
3. හඬට ඉඩක් වැඩසටහන පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සඳහාමාර්ගෝපදේශ පොත් 2,000ක් නිකුත් කිරීම
4. දිස්ත්‍රික් මට්ටමේ සහ පළාත් මට්ටමේ ප්‍රජා විමර්ශකයින්ගේ සංසද ජාල ගත කිරීම සඳහා වැඩමුළු 02ක් පැවැත්වීම.

# ඊ-සභා ජංගම දුරකථන යෙදවුම හා එහි ක්‍රියාකාරීත්වය

## ඊ-සභා ජංගම දුරකථන යෙදවුම හඳුන්වා දීම

ප්‍රාදේශීය සැලසුම් කරණයේ දී ජනතා සහභාගීත්වය ඉහළ නැන්වීම, පුරවැසියන් සහ තීරණ ගන්නන් අතර ඇති පරතරය අවම කිරීම සහ ඔවුන්ගේ හඬ මතු කර ගැනීමට වඩා හොඳ වේදිකාවක් සැපයීම සඳහා, ජනතාවට සමීපතම ආයතන ලෙස පළාත් පාලන ආයතන හා සම්බන්ධ සියලු ම පාර්ශ්වකරුවන් එකට සම්බන්ධ කිරීම යන අරමුණු ඉටු කර ගැනීම සඳහා හඬට ඉඩක් ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

හඬට ඉඩක් ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීම සඳහා භාවිත කරනු ලබන ප්‍රධාන උපාය මාර්ගයක් ලෙස ඊ-සභා ජංගම දුරකථන යෙදවුම යොදා ගනු ලැබූ අතර අද වන විට එය පළාත් පාලන ආයතන සහ එහි ප්‍රජාව සම්බන්ධ කරන වඩාත් ම ප්‍රායෝගික තාක්ෂණික මෙවලම බවට පත්ව ඇත.

## ඊ- සභා ජංගම දුරකථන යෙදවුමේ ප්‍රතිලාභ

### ඊ-සභා ජංගම දුරකථන යෙදවුමේ ප්‍රතිලාභ ශීර්ෂ තුනක් යටතේ විග්‍රහ කර දැක්විය හැකි ය. එනම්

1. පළාත් පාලන ආයතනවලට ලැබෙන ප්‍රතිලාභ
2. සාමාන්‍ය ජනතාවට ලැබෙන ප්‍රතිලාභ සහ
3. සභිකයින්ට (මන්ත්‍රී තුමන්) ලැබෙන ප්‍රතිලාභ යනුවෙනි.



### පළාත් පාලන ආයතනවලට ලැබෙන ප්‍රතිලාභ

- e-Sabha ජංගම යෙදවුම පළාත් පාලන ආයතන සහ එහි ප්‍රජාව සම්බන්ධ කරන වඩාත් ම උපාය මාර්ගික මෙවලම වීම.
- තම පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා පළාත් පාලන ආයතනවලට පැමිණෙන මහජනතාව සංඛ්‍යාත්මක ව අඩු වීම.
- පළාත් පාලන ආයතනවල නිලධාරීන්ගේ වැඩකටයුතු පහසු වීම.
- ඔවුන්ට පහසුවෙන් පද්ධතිය නිරීක්ෂණය කළ හැකි අතර වැඩි කාලයක් ගත නො කර ජනතාවගේ පැමිණිලිවලට ප්‍රතිචාර දැක්විය හැකි වීම.
- එය පළාත් පාලන ආයතනවලින් සිදු කෙරෙන සේවයන් කෙරෙහි මෙන් ම පළාත් පාලන නියෝජිතයින් සහ නිලධාරීන් කෙරෙහි දක්වන විශ්වාසය ද වැඩි කිරීම.
- සම්පත් නාස්තිය, දූෂණය සහ අල්ලස් සෑම ආකාරයකින් ම සැලකිය යුතු ලෙස අඩු කිරීමට උපකාරී වීම.
- පළාත් පාලනයේ සෑම මට්ටමක දීම ඵලදායී ලෙස, වග වීමෙන් සහ විනිවිදභාවයෙන් යුතු ව තීරණ ගැනීම සඳහා උපකාරී වීම.





- ප්‍රජා ගැටලු සහ සංවර්ධන යෝජනා ප්‍රජාව හරහා පළාත් පාලන ආයතන වෙත දැනුම් දීමත් පළාත් පාලන ආයතන විසින් එම පැමිණිලි සඳහා කඩිනම් ප්‍රතිචාරදැක්වීමත් මෙමගින් පහසු වීම.
- මහජන දැනුවත් කිරීම් සඳහා e-Sabha ජංගම යෙදවුම භාවිත කළ හැකි වීම.
- පුද්ගලයකු කරන පැමිණිල්ල අදාළ පළාත් පාලන ආයතනයේ පැමිණිලි පුවරුවේ මෙන් ම පළාත් පාලන කොමසාරිස්වරයාගේ පැමිණිලි පුවරුවේ ද දර්ශනය වීම. මේ නිසා මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි පිළිබඳව මෙන් ම ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳව ද නො විසඳුණු පැමිණිලි පිළිබඳව ද පළාත් පාලන කොමසාරිස්වරයා දැනුවත් වීම.
- වාර්ෂික කාර්ය සාධන වාර්තා සැකසීමේ දී පළාත් පාලන ආයතනවලට ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳව හා නො විසඳුණු පැමිණිලි පිළිබඳව ප්‍රගතිය ඇතුළත් කිරීමේ දී e-Sabha ජංගම යෙදවුම මගින් එම තොරතුරු පළාත් පාලන ආයතනවලට මෙන් ම පළාත් පාලන කොමසාරිස්වරයාට ද පහසු වෙන් ලබා ගත හැකි වීම.
- පළාත් පාලන ආයතනවලට ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් පැමිණිලිකරුට ක්ෂණිකව ප්‍රතිචාර ලබා දිය හැකි වීම.
- පැමිණිලි විසඳීම පිළිබඳව ප්‍රතිලාභියාගේ ප්‍රතිචාර ඇගයීම ශ්‍රේණිගත කළ හැකි වීම. (rating)
- පොදු පණිවිඩ SMS ලෙස යැවිය හැකි වීම.
- විදුලි බල මණ්ඩලය, ටෙලිකොම් හා ජල සම්පාදන වැනි පාර්ශ්වකාර ආයතන සඳහා පරිපාලක පුවරු හඳුන්වා දීම මගින් කඩිනමින් ඔවුන් වෙත පැමිණිලි යොමු කළ හැකි වීම.
- ප්‍රදේශයේ සේවා සපයන්නන්ගේ තොරතුරු ජංගම දුරකථන යෙදවුම හරහා ලබා දිය හැකි වීම.
- සිද්ධියට අදාළ ස්ථානයේ පිහිටීම (location) ද සටහන් වන හෙයින් සභාවේ නිලධාරීන්ට නිර්නාමික පැමිණිලිකරුවන්ගේ සහාය නොමැති ව ගූගල් මාර්ග සිතියම (google map) භාවිතා කරමින් අදාළ ස්ථානයට ලඟා විය හැකි වීම.



**සාමාන්‍ය ජනතාවට ලැබෙන ප්‍රතිලාභ:**

- සාමාන්‍ය ජනතාවට ඔවුන්ගේ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා පළාත් පාලන ආයතනයට යාම් ඊම් වෙනුවෙන් යොදවන තමන්ගේ වටිනා කාලය හා මුදල් ඉතිරි කර ගනිමින් නිවසේ සිට ම ඔවුන්ගේ පැමිණිලි පළාත් පාලන ආයතනය වෙත යොමු කිරීමට මෙමගින් අවස්ථාව උදා වී ඇත.
- පැමිණිල්ල සමඟ ඡායා රූප හෝ වීඩියෝවක් යැවීමේ පහසුකම ලැබී ඇත.
- රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල සේවය කරන්නන්ට පළාත් පාලන ආයතනවලට යාම සඳහා නිවාඩු ලබා ගැනීම අවශ්‍ය නො වේ.





- ඔවුන් නිවාඩු ලබා ගැනීම නිසා ආයතන ප්‍රධානීන් හා මහජනතාව මුහුණ පාන දුෂ්කරතා අවම වේ.
- පළාත් පාලන ආයතනවලට ඉදිරිපත් කරන පැමිණිලි සම්බන්ධයෙන් පැමිණිලි කරුට ක්ෂණිකව ප්‍රතිචාර ලබා ගත හැකි වේ.
- විදුලි බල මණ්ඩලය, ටෙලිකොම් හා ජල සම්පාදන වැනි හවුල්කාර ආයතනවලට අදාළ ව මහ ජනතාව වෙතින් ලැබෙන පැමිණිලි (කණු කඩා වැටීම, කණු ඇලවීම, ජල කාන්දුව වැනි) පළාත් පාලන ආයතනය විසින් යෙදවුම හරහා ඔවුන් වෙතයොමු කිරීම මගින් එම පැමිණිලි සඳහා කඩිනම් ප්‍රතිචාර ලබා ගත හැකි වේ.
- මාර්ග අලුත්වැඩියාවක් සම්බන්ධව පැමිණිල්ලක දී එම මාර්ගය අයත් වන්නේ පළාත් පාලන ආයතනයකට ද නැතහොත් පළාත් සභාවට ද යන්න නිශ්චය කර ගැනීම දුෂ්කර වන අවස්ථා ඇත එලෙස පැමිණිලි ඉදිරි පත් කළ යුතු ආයතනය නිශ්චිතව නො දන්නා අවස්ථාවක දී, එබඳු පැමිණිලි පළාත් පාලන ආයතනයට යොමු කළ පසු පළාත් පාලන ආයතන විසින් එම පැමිණිලි අදාළ ආයතනයට යොමු කරනු ලැබේ. එමගින් තම පැමිණිල්ලට කඩිනම් ප්‍රතිචාර ලබා ගැනීමට මෙමගින් ජනතාවට පහසු වේ.
- පැමිණිලි යොමු කිරීමේ දී එය යොමු කරන තැනැත්තා අදාළ පළාත් පාලන ප්‍රදේශයේ පදිංචිකරුවකු වීම අත්‍යවශ්‍ය නො වේ. මාර්ගයක ගමන් කරමින් සිටිය දී අනතුරු දායක ගසක් දුටු විට ළඟ ම ඇති පළාත් පාලන ආයතනයට තම පැමිණිල්ල ඉදිරි පත් කළ හැකි වේ.
- ගාල්ල මහා නගර සභා බල ප්‍රදේශයට අයත් සිදුවීමකට අදාළ පැමිණිල්ලක් කිසිවකු විසින් බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාවට යොමු කර ඇත්නම්, එම පැමිණිල්ල බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාව විසින් ගාල්ල මහ නගර සභාවට යොමු කෙරේ. එමගින් තම පැමිණිල්ලට කඩිනම් ප්‍රතිචාර ලබා ගැනීමට මෙමගින් ජනතාවට පහසු වේ.
- ඕනෑම පුද්ගලයකුට නාමික ව හෝ නිර්නාමික ව මෙම ජංගම දුරකථන යෙදවුම හරහා පැමිණිලි කළ හැකි වේ.
- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ම පැමිණිලි ඉදිරිපත් කළ හැකි වේ.

**පළාත් පාලන ආයතනවල සභිකයින්ට (මන්ත්‍රීතුමන්) ලැබෙන ප්‍රතිලාභ:**

- පාලන නියෝජිතයින්ට ද පාලක පුවරුවක් (dashboard) ලැබෙන බැවින් e -Sabha ජංගම යෙදවුම හරහා තම බල ප්‍රදේශයට අදාළ ව ලැබෙන පැමිණිලි සඳහා ඒ මොහොතේ ම පියවර ගත හැකි වීම නිසා ඔවුන්ගේ වැඩකටයුතු පහසු වේ.
- රැකියාව සඳහා ගමෙන් බැහැරව සිටිය ද e -Sabha ජංගම යෙදවුම හරහා පැමිණිලි ලබා ගත හැකි වේ.

- වාචික ව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීම අමතක වුව ද e -Sabha ජංගම යෙදවුම හරහා ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීම අමතක නො වේ.
- තමා නො දැන සභාවෙන් ලබා දෙන විසඳුම්වල ගෞරවය ද තමාට හිමි වේ.
- e-Sabha ජංගම යෙදවුම හරහා තම බල ප්‍රදේශයට අදාළ ව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් විසඳුම් ලබා දීමේ ප්‍රගතිය ලිඛිත ව මාසික සභා රැස්වීමේ දී තමාට ලබා ගත හැකි වේ.

## ස්මාර්ට් සිටි සංකල්පය හා e-Sabha ජංගම යෙදවුම

දිනෙන් දින දියුණු වෙමින් පවත්නා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මත පදනම් වූ ලෝකය, නව කාර්මික විප්ලවයේ තවත් යුගයක් වෙත ගමන් කරමින් පවතී. මෙය හතර වන කාර්මික විප්ලවය (The fourth industrial revolution) ලෙස හඳුන්වනු ලැබේ. කෘත්‍රිම බුද්ධිය, යාන්ත්‍රික ඉගෙනීම, ස්වයංක්‍රිය කරණය සහ රොබෝ තාක්ෂණය පාදක කොට ගත් ගෝලීය ආර්ථිකයේ වෙනස් වීම මේ යුගය හා සමග සම්බන්ධව පවතී. මේවා සියල්ල ඩිජිටල් තාක්ෂණය මත පදනම් ව ඇති අතර ස්මාර්ට් සිටි සංකල්පය ඉන් එකකි. ලෝකයේ බොහෝ සංවර්ධිත රටවල් සංවර්ධනයේ සහ කළමනාකරණයේ සෑම අංශයක ම ස්මාර්ට් සිටි සංකල්පය ක්‍රියාත්මක කරයි.

ස්මාර්ට් සිටි සංකල්පය යනු තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය හා කෘත්‍රිම බුද්ධිය භාවිත කිරීම මඟින් සම්පත් පරිභෝජනය, නාස්තිය සහ සමස්ත පිරිවැය අවම කිරීම සඳහා බලශක්තිය, ප්‍රවාහනය සහ උපයෝගීතා වැනි නාගරික සේවාවන්හි ගුණාත්මක භාවය සහ ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම තුළින් පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම මෙන් ම සමාජ මැදි හත් වීම වැඩි කිරීමට අවශ්‍ය පියවර ගැනීම වේ. මානව වර්ගයාගේ කාර්යයන් හා ගැටලු විසඳීම පහසු කිරීම මෙහි තවත් අරමුණකි. ලෝකයේ සෙසු රටවල් හතර වන කාර්මික විප්ලවය ගැන කතා කරන විට අවම වශයෙන් තුන්වන කාර්මික විප්ලවයේ දී හෝ ඩිජිටල් සහ අන්තර්ජාල තාක්ෂණය තුළින් නිසි ප්‍රයෝජනයක් ලබා ගැනීමට ශ්‍රී ලංකාව අසමත් විය.

හතර වන කාර්මික විප්ලවයට අප කිසි සේත් සූදානම් නැති බැව් පැහැදිලිව පෙනී යන කරුණකි. ලංකාවේ බොහොමයක් රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල තොරතුරු තාක්ෂණය තුළින් ඉතාමත් පහසුවෙන් කර ගත හැකි කාර්යයන් පවා තවමත් සිදු කරනු ලබන්නේ සම්ප්‍රදායික ක්‍රම භාවිතයෙනි. e-Sabha ජංගම යෙදවුම HELP -O විසින් පළාත් පාලන ආයතන වලට හඳුන්වා දෙන ලද්දේ මෙ වැනි පසුබිමක් යටතේ ය. ස්මාර්ට් සිටි සංකල්පයට අනුව යමින් ඇති කළ, e-Sabha ජංගම යෙදවුම පළාත් පාලන ආයතන සහ ප්‍රජාව අතර යහපත් සබඳතා ඇති කරණාලමක් ලෙස ක්‍රියා කරනු ඇති බැව් HELP-O ආයතනයේ විශ්වාසය යි.

## ඩිජිටල් පරිවර්තනය හා e-Sabha ජංගම යෙදවුම

ඩිජිටල් පරිවර්තන ප්‍රවණතාව සමාජයේ සෑම අංශයකට ම  ව්‍යාප්ත වී ඇත. ඩිජිටල් තාක්ෂණයේ ඇති වාසි හේතුවෙන් මේ තත්ත්වය ඇති වී ඇත. ඩිජිටල් තාක් ෂණය හොඳින් භාවිත කළ හැකි එක් අංශයක් වන්නේ පළාත් පාලනය යි. සාමාන්‍ය ජනතාව සඳහා තොරතුරු වෙත ප්‍රවේශ වීම වැඩිදියුණු කිරීමට සහ අත්‍යවශ්‍ය  සේවා කඩිනමින් ලබා දීමට ඩිජිටල් තාක්ෂණය යොදා ගත හැකි ය. මෙම බලගතු කළමනාකරණ මෙවලම තොරතුරුවල නිරවද්‍යතාව සහතික කරයි.



### පළාත් පාලනයේ දී ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීමේ වාසි

- ලේඛන කටයුතු සඳහා ගත වන කාලය අවම වීම,
- පරිපාලන ක්‍රියාවලින් විධිමත් කිරීම,
- පොදු මහජනතාව අතර රජය කෙරෙහි විශ්වාසය ශක්තිමත් කිරීම,
- රාජ්‍ය කළමනාකරණ මෙහෙයුම්වල අවංකභාවය සහ විනිවිද භාවය වැඩි දියුණු කිරීම.

### පළාත් පාලනයේ දී ඩිජිටල් කරණය ක්‍රියාත්මක කිරීම පසුබෑමකට ලක් වීමට හේතු

සමහර ආයතන ඩිජිටල් කරණය  භාවිතයේ දී වඩා වැඩි ප්‍රගතියක් අත් කර ගනිමින් සිටින අතර තවත් සමහරක් ආයතන ඩිජිටල් කරණය  ක්‍රියාත්මක කිරීමේ දී කණගාටුදායක ලෙස  පසුබෑමකට ලක් ව  ඇත. ඊට බල පෑ හේතු රාශියක් ඇත.

- ඩිජිටල් මුලපිරීම් සඳහා ප්‍රමාණවත් සහයෝගයක් ප්‍රතිපත්ති සම්පාදකයන්ගෙන් නො ලැබීම.
- විවිධ රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණයක් නොමැතිකම.
- ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන හා උපකරණ  නොමැතිකම.
- පරිපාලනය වෙනස් කිරීමට අකමැති අය ලබා දෙන  නුසුදුසු උපදේශන.
- නවීන සන්නිවේදන උපකරණ භාවිතය පිළිබඳ ඇති නො දැනුවත් කම හා අකමැත්ත.
- මෙතෙක් කටයුතු කර ගෙන ආ විදිය වෙනස් කිරීමට ඇති අකමැත්ත.
- මට ඉන් ඇති ප්‍රයෝජනය කුමක් දැයි විමසිලි මත් වීම WIIFM (What's In It For Me)

### e-Sabha ජංගම යෙදවුම බා ගත කිරීමේ පියවරයන්

- Android- Google Play Store හෝ iPhone-App store, Huawei - App Gallery මඟින් බා ගත කර විවෘත කර ගන්න
- ඔබගේ දුරකථන අංකය ඇතුළත් කර ඉදිරියට යන්න.
- SMS හරහා ඔබට ලැබෙන OTP අංකය ඇතුළු කරන්න.

- පරිශීලකයාගේ නම, විද්‍යුත් තැපෑල සහ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කරන්න.
- ලියාපදිංචියෙන් පසුව, යෙදවුම වෙත ප්‍රවේශ වීමට පරිශීලකයාගෙන් විමසනු ඇත.
- ඉන් පසු මතු වන යෙදවුමේ මුල් තිරයේ පරිශීලකයාට කළ හැකි පැමිණිලි වර්ග දැකිය හැකි ය.
- අතුරු මුහුණතේ දිස් වෙන තරු ලකුණ මගින් ඔබට අවශ්‍ය භාෂාව තෝරා ගන්න.
- යෙදවුම සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන් ම ක්‍රියා කරයි.
- පැමිණිලි කිරීමේ ක්‍රියාවලිය
    - පැමිණිලි ක්ෂේත්‍රය තෝරන්න
    - ඡායා රූප 3ක් හෝ වීඩියෝ තුනක් දක්වා උඩු ගත කරන්න
    - ඡායා රූප එම ස්ථානයේ දී ගැනීමට හෝ දුරකථනයේ ගැලරියෙන් තෝරා ගැනීමට හැකි ය.
    - විදුලි පහන් අක්‍රිය වීමක දී කණුවේ අංකය පැහැදිලිව පෙනෙන සේ ඡායා රූප ගත යුතු ය.
    - අවශ්‍ය නම් වීඩියෝ පටයක් එක් කරන්න උදා: ජල කාන්දුවක්
    - ස්ථානය තෝරන්න (location)
    - ස්ථානය හඳුනා ගැනීමට තොරතුරු එක් කරන්න
    - ඔබව සම්බන්ධ කර ගැනීමට තොරතුරු එක් කළ හැකි නම් වඩා යෝග්‍ය වේ.
    - පැමිණිල්ල විස්තර කරන්න
    - අදාළ දිස්ත්‍රික්කය සහ පළාත් පාලන ආයතනය තෝරා පැමිණිල්ල ඉදිරිපත් කරන්න
    - එය තව දුරටත් තහවුරු කරන ලෙස ඉල්ලනු ඇත. තහවුරු කරන්න.
    - පැමිණිල්ල පළාත් පාලන ආයතනය වෙත යොමු වී ඇත.
    - පැමිණිල්ල ලැබුණු බවට SMS පණිවුඩයක් ඔබට ලැබෙනු ඇත.

**e-Sabha** ජංගම යෙදවුමේ අඩංගු පැමිණිලි කළ හැකි ක්ෂේත්‍ර

- අක්‍රිය වීථි පහන්
- මාර්ගයට අනතුරුදායක ගස්
- ගොඩනැගිලි සීමාවේ අනවසර ඉදිකිරීම්
- අනවසර පදික වෙළඳාම
- මාර්ගයට කසල බැහැර කිරීම
- මාර්ගයට අප ජලය බැහැර කිරීම
- අපවිත්‍ර වූ කාණු
- ගොඩ දැමූ කාණු පස් ඉවත් නො කිරීම

- බිඳුණු කාණු වසන ලෑලි
- මාර්ගයේ අවදානම් පැවතීම
- අවදානම් දැන්වීම් පුවරු
- අයාලේ යන ගවයින්
- පොදු වැසිකිළිවල ගැටලු
- අනතුරුදායක තාප්ප /ගොඩනැගිලි
- අපවිත්‍ර පොදු ළිං
- මාර්ගය දෙපස කාණු පද්ධතියට හානි වීම්
- පොදු නාම පුවරුවලට හානි වීම්
- අපවිත්‍ර බස් නැවතුම්
- මදුරුවන් බෝවෙන ස්ථාන හා වෙනත්
- එහි 'වෙනත්' යන ක්ෂේත්‍රයෙහි ඉහත ගණයන්ට නො වැටෙන පැමිණිලි ඇතුළත් කළ හැකි ය.
- එමෙන් ම පළාත් පාලන ආයතනයේ වගකීමක් නො වන දුරකථන, විදුලිය හා පානීය ජල සම්පාදන වැනි ක්ෂේත්‍ර වලට අයත් පැමිණිලි ද 'වෙනත්' යටතේ ඇතුළත් කළ හැකි ය.

## e-Sabha ජංගම යෙදවුමෙන් ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන ක්‍රියා කළ යුතු ආකාරය

e-Sabha ජංගම යෙදවුමෙන් ලැබෙන පැමිණිලි මත පදනම් ව, පළාත් පාලන ආයතනවලට පැමිණිලි සඳහා ප්‍රවේශ විය හැකි අතර එය ලේඛනයක් ලෙස බාගත කොට අදාළ නිලධාරියා වෙත යොමු කළ යුතු ය. නැතහොත් WhatsApp/ Email මඟින් අදාළ නිලධාරියා වෙත යොමු කළ යුතු ය. පැමිණිල්ල විසඳීම සඳහා කඩිනමින් පියවර ගත යුතු ය. ඊට අදාළ ව ගනු ලබන සියලු ම පියවර සම්බන්ධයෙන් පැමිණිලි කරු අඛණ්ඩව දැනුවත් කළ යුතු ය. විසඳිය නො හැකි නම් හෝ විසඳීමට කල් ගත වන්නේ නම් ඒ සම්බන්ධයෙන් ද පැමිණිලි කරු දැනුවත් කළයුතු ය. පැමිණිල්ල විස ඳූ පසු ඒ සම්බන්ධයෙන් පැමිණිලි කරු දැනුවත් කළ යුතු ය. මේ සඳහා ඡායා රූප හෝ වීඩියෝවක් යොදා ගත හැකි ය.

පළමු අදියර යටතේ පළාත් පාලන ආයතන වල නිලධාරීන් පස් දෙනකුට පුහුණු වීම් ලබා දී ඇත. ඔවුන් පළාත් පාලන ආයතන ක්‍රියාකාරී මෙහෙයුම් කණ්ඩායම. නමින් හැඳින් වේ. අදාළ යෙදවුමට ඇතුළු වී පැමිණිලි වලට පිළිතුරු ලබා දීම සම්බන්ධව ඔවුන් පුහුණු කර ඇත. පුහුණුව ලැබූ ඇතැම් නිලධාරීන් මේ වන විට ස්ථාන මාරු වීම් ලැබ ඇත. ඒ වෙනුවට නව නිලධාරීන් පත් කර ඇත. ඔවුන් නැවත පුහුණු කළ යුතු ය.

## **e-Sabha** ජංගම යෙදවුම ප්‍රවර්ධනය කිරීම, එහි දිගු කාලීන පැවැත්ම තහවුරු කිරීම සහ පළාත් පාලන ආයතන දිරි ගැන්වීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ගත යුතු ක්‍රියා මාර්ග

- ලැබෙන පැමිණිලි විසඳීම සඳහා වැඩි දායකත්වයක් දක්වන පළාත් පාලන ආයතන දිරි ගැන්වීම සඳහා වාර්ෂිකව සම්මාන ලබා දීමේ වැඩ පිළිවෙළක් සැකසීම.
- මේ සඳහා ඇගයීම් පටිපාටියක් සකස් කිරීම.
- පළාත් පාලන ආයතනවල ක්‍රියාකාරී මෙහෙයුම් කණ්ඩායම්වල කාර්ය සාධනය ද අඛණ්ඩව ඇගයීමට ලක් කර දිරි ගැන්වීම.
- පළාත් පාලන ආයතන වල ක්‍රියාකාරී මෙහෙයුම් කණ්ඩායම අඛණ්ඩව පුහුණු කිරීම.
- මෙහෙයුම් කණ්ඩායමට සහාය වන ක්ෂේත්‍ර කණ්ඩායම අඛණ්ඩව පුහුණු කිරීම.
- පළාත් පාලන ආයතනවලට ලැබෙන පැමිණිලි භාර ගන්නා එක ම මාධ්‍ය e -Sabha ජංගම යෙදවුම බවට පත් කිරීම. (only solution)
- e-Sabha ජංගම යෙදවුම දකුණු පළාතේ පළාත් පාලන ආයතන 49 තුළ ම ප්‍රවර්ධනයකිරීම.
- e-Sabha ජංගම යෙදවුම දකුණු පළාතේ පළාත් පාලන ආයතන වල මුල් බැස ගත් පසු ක්‍රමානුකූල ව හෙල්පෝ ආයතනය විසින් ඒවායේ භාරකාරත්වය පළාත් පාලන කොමසාරිස් වරයාගේ එකඟතාව මත පළාත් පාලන ආයතනවලට ම භාර දීම.
- e-Sabha ජංගම යෙදවුම පවත්වා ගෙන යාම හා නඩත්තුව සඳහා පළාත් සභාවේ වෙනම ඒකකයක් පිහිටු වීම.
- මේ සඳහා සියලු පාර්ශ්වකරුවන් සමග සාකච්ඡා කොට අවබෝධතා ගිවිසුමකට එළඹීම.
- දෛනිකව, සතිපතා, මාස්පතා සහ වාර්ෂිකව -Sabha ජංගම යෙදවුමට ලැබෙන පැමිණිලිවල ප්‍රගතිය විශ්ලේෂණය කිරීමේ ක්‍රමවේදයක් සැකසීම.
- පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති පාලක පුවරුව භාවිතයෙන් අවධානය යොමු නො කළ හා විසඳීමට පමා වී ඇති පැමිණිලි පිළිබඳව කඩිනම් තීරණ ගැනීම.



# ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත නීතිය තුළ අතුරු ව්‍යවස්ථා සම්පාදනයේ වැදගත්කම

## ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත නීතිය

කලින් කල රට පාලනය කරන පාලකයින් විසින් පනවන නීති ව්‍යවස්ථාපිත නීතිය ලෙස හැඳින්වේ. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත නීතිය ප්‍රධාන අංශ තුනක් යටතේ හඳුනා ගත හැක. එනම්, ආඥා පනත්, පාර්ලිමේන්තු පනත් හා ජාතික රාජ්‍ය සභා නීති වශයෙනි. මෙයට අමතර ව පනවන ප්‍රඥප්ති හා අතුරු ව්‍යවස්ථා ද ව්‍යවස්ථාපිත නීතියේ අංගයන් වේ.

**ආඥා පනත්:** ශ්‍රී ලංකා ජනරජයේ පාර්ලිමේන්තුව පිහිටුවීමට ප්‍රථමයෙන් යටත් විජිත පාලන සමය තුළ යටත් විජිත පාලකයින් (මහ රජු) මෙරටට පනවන්නට යෙදුණු නීතීන් ආඥා පනත් නමින් හැඳින්වේ. 1861 අංක 10 දරණ මංමාවත් ආඥාපණත (Thoroughfares Ordinance No.10 of 1861) ලංකාවේ පළාත් පාලනයට අදාළව බිහි වූ මුල්ම නීතිය ලෙස සැලකේ. මේ යටතේ පළාත් මාර්ග කමිටු හා දිස්ත්‍රික් මාර්ග කමිටු පිහිටවනු ලැබීය.

**පාර්ලිමේන්තු පනත්:** යටත් විජිත පාලනයෙන් පසු, 1948 සිට 1972 දක්වා හා වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80(1) වගන්තිය අනුව, 1978න් පසු පාර්ලිමේන්තුව විසින් සම්මත කර, පනවන්නට යෙදෙන නීතීන් පාර්ලිමේන්තු පනත් නමින් හැඳින්වේ.

**ජාතික රාජ්‍ය සභා නීති:** ශ්‍රී ලංකා ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ 1972 සිට 1978 කාල පරිච්ඡේදය තුළ පනවන්නට යෙදුණු නීති ජාතික රාජ්‍ය සභා නීති නමින් හැඳින්වේ. උදා: 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය. (1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත)

**ප්‍රඥප්ති:** පළාත් සභා විසින් සම්මත කර, පනවන්නට යෙදෙන නීතීන් ප්‍රඥප්ති නමින් හැඳින්වේ.

**අතුරු ව්‍යවස්ථා:** පළාත් පාලන ආයතන විසින් සම්මත කර, පනවන්නට යෙදෙන නීතීන් අතුරු ව්‍යවස්ථා නමින් හැඳින්වේ.

## අතුරු ව්‍යවස්ථා සම්පාදනයේ වැදගත්කම

පළාත් පාලන ආයතනයක් යනු නීතියෙන් සංස්ථාපනය කරන ලද නෛතික පුද්ගලයෙකු වේ. නෛතික පුද්ගලයකු කටයුතු කිරීමේ දී සෑම විටම නීතිමය රාමුව තුළ ක්‍රියාත්මක වීම අනිවාර්ය අවශ්‍යතාවකි. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන විසින් ස්වකීය කාර්ය සහ කර්තව්‍යය ඉටු කළ යුතු ආකාරය ව්‍යවස්ථාපිත නීතීන් රාශියක් මගින් පෙන්වා දී ඇත. එම ව්‍යවස්ථාපිත නීති මඟින් පැවරී ඇති කාර්ය හා කර්තව්‍යය නීතියෙහි සඳහන් ප්‍රමාණයට ම ඉටු කිරීමට පළාත් පාලන ආයතනය නීතියෙන් බැඳී සිටී.

පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති කර්තව්‍යය මහ නගර සභා ආඥා පනතේ 4 වගන්තිය මගින් ද නගර සභා ආඥා පනතේ 4 වගන්තිය මගින් ද 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 4 වගන්තිය මගින් ද විස්තර කර ඇත. මෙම කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත මහ නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත සහ ප්‍රාදේශීය සභා පනත මගින් විධිවිධාන සලසා ඇත. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥා පනතින් (252 අධිකාරිය), 1939 අංක 61 නගර සභා ආඥා පනතින් (255 අධිකාරිය) සහ 1987 අංක15 දර න ප්‍රාදේශීය සභා පනතින් පළාත් පාලන ආයතනයන් ක්‍රියා කළ යුතු නීතිමය පසුබිම පැහැදිලි කර ඇත.

මීට අමතරව විවිධ අනපනත්, රීති, රෙගුලාසි සහ පූර්වාදර්ශ නඩු තීන්දු රාශියක් මගින් අවශේෂ විධිවිධාන පළාත් පාලන ආයතන වෙත සලසා දී ඇත. ඊට අතිරේක ව පළාත් පාලන ආයතන වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා වෙනත් ප්‍රධාන පනත් රාශියක් මගින් ද බලය ලබා දී ඇත.

පළාත් පාලන ආයතනයට පැවරී ඇති කාර්ය හා කර්තව්‍යය විධිමත් ව ඉටු කිරීම සඳහා ඉහත කී පනත් හා නීති ප්‍රමාණවත් නො වන අවස්ථාවල දී අතිරේක බලතල ඇති කර ගැනීමට අනු නීති පනවා ගත හැකි ය. එසේ පැනවිය හැකි අනු නීති වශයෙන් රීති, රෙගුලාසි හා අතුරු ව්‍යවස්ථා ආදිය විශේෂයෙන් හැඳින්විය හැකි ය. මේවා අතරින් අතුරු ව්‍යවස්ථා ඉතා වැදගත් වේ. පළාත් පාලන ආයතන විසින් අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම හෝ පිළිගැනීම සිදු කරනු ලබයි. එ මගින් තම බල ප්‍රදේශයට ගැළපෙන පරිදි වඩාත් ප්‍රායෝගික නීති නිර්මාණය කර ගැනීම පළාත් පාලන ආයතන විසින් සිදු කරනු ලබයි.

පළාත් පාලන ආයතන සේවා සැපයීමේ දී මුහුණ පාන ප්‍රායෝගික හා නීතිමය ගැටලු හඳුනා ගෙන එම දුෂ්කරතා මඟ හරවා ගැනීම සඳහා සම්මත අතුරු ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමට මෙම ව්‍යාපෘතිය මගින් පළාත් පාලන ආයතනවලට අවශ්‍ය විශේෂඥ සහාය ලබා දෙනු ඇත.

1952 අංක 6 දරනපළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනත මගින් (The Local Authorities Standard By- Laws Act No. 6 of 1952) පළාත් පාලන ආයතනවලට අවශ්‍ය වන අතුරු ව්‍යවස්ථා සම්පාදනය හා සම්මත කර ගැනීමේ බලය පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාට ලබා දී ඇත. මේ යටතේ පළාත් පාලන ආයතන සඳහා වෙන වෙන ම සම්මත ආදර්ශ අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීම සිදු විය. එමගින් යම් පළාත් පාලන ආයතනයකට තමන්ට අවශ්‍ය අතුරු ව්‍යවස්ථාවක් වැළඳ ගැනීමේ හැකියාව ලබා දී ඇත. මේවා සම්මත අතුරු ව්‍යවස්ථා නමින් හැඳින් වේ.

දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පළාත් සභා පිහිටුවීමෙන් පසුව අතුරු ව්‍යවස්ථා, රීති හා නියෝග සම්බන්ධ බලතල පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරිණි. ඒ අනුව පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා ඇති විධිවිධාන 'පළාත් සභාවට ඉදිරිපත් කිරීම යනුවෙන්' ආදේශ කර ගත යුතු ය.

## අතුරු ව්‍යවස්ථා සම්පාදනය සඳහා මූලික නීතියේ දක්වා ඇති ප්‍රතිපාදන

- 1947 අංක 29 දරන ආඥා පනතින් සංශෝධිත 1865 අංක 17 දරන මහා නගර සභා ආඥා පනතේ 267 වගන්තිය
- 1947 අංක 29 දරන ආඥා පනතින් සංශෝධිත 1865 අංක 17 දරන මහා නගර සභා ආඥා පනතේ 87 වගන්තිය මගින් රීති සෑදීමට.
- 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ 94 සහ 153 වගන්ති.
- 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 69 සහ 122 වගන්ති.

## අතුරු ව්‍යවස්ථා සම්පාදනය කළ හැකි විෂය ක්ෂේත්‍ර

- අතුරු ව්‍යවස්ථා සම්පාදනය කළ හැකි විෂය ක්ෂේත්‍ර 32ක් මහා නගර සභා ආඥා පනතේ දක්වා ඇත.
- නගර සභා ආඥා පනතේ මේ විධිවිධාන ශීර්ෂ 15ක් යටතේ දක්වා ඇත.
- ප්‍රාදේශීය සභා පනතේ මේ විධිවිධාන ශීර්ෂ 30ක් යටතේ දක්වා ඇත.

## අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීමේ දී එහි වලංගුභාවය සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිය යුතු කරුණු

- සර්ව සාධාරණ වීම.
- නිශ්චිත වීම.
- බලාතික්‍රමණය නො කළ යුතු වීම.
- නීතිමය ක්‍රියා පටිපාටිය තුළ සකස් විය යුතු වීම.
- සියලු දෙනා වෙත සමානාත්මතාව සැලසෙන පරිදි පැවතීම.
- අතුරු ව්‍යවස්ථාව පනවනු ලබන්නේ කුමන කරුණක් සඳහා ද යන්න තහවුරු වන පරිදි අරුත් සහ යෙදුම් නිශ්චිතව යොදා තිබීම.
- ව්‍යවස්ථාපිත නීතියට පටහැණි නො වන ලෙස සහ බල සීමාවක් ඉක්මවා නො යන පරිදි පැවතීම.
- කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාවේ සිට අදාළ අනුමැතිය ලබා ප්‍රකාශයට පත් කරන තෙක් ක්‍රියාවලිය නියමානුකූල ව සිදුවීම
- නීතියට පටහැණි අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ඕනෑම පුරවැසියෙකුට ඕනෑම අවස්ථාවක අධිකරණය හමුවේ එය අභියෝගයකට ලක් කළ හැකි වීම.
- අධිකරණයක් ඉදිරියේ අදාළ අතුරු ව්‍යවස්ථාව නීතියට පටහැණි බව ඔප්පු වුව හොත් එය අධිකරණය විසින් බල රහිත කරනු ලැබිය හැකි වීම.

එබැවින්, අතුරු ව්‍යවස්ථා සම්පාදනයේ දී නීතියෙන් නියම කර ඇති ඉහත සියලු කරුණු කෙරෙහි සැලකිලිමත් ව හා දැනුවත් ව ක්‍රියා කළ යුතු ය.

## අතුරු නීති කඩ කිරීම් සම්බන්ධයෙන් ඇති ප්‍රතිපාදන

- අතුරු නීති කඩ කිරීම් සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 136(1)( ආ) වගන්තියෙ විධිවිධාන අනුව පළාත් පාලනආයතනයක නිලධාරියකුට මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ නඩු පැවරීමේ බලය ඇත.
- පළාත් පාලන ආයතනයක් විසින් එවැනි නඩු පැවරීමක් සිදු කරන්නේ නම්, අදාළ වරද සිදු කර මාස 06ක කාලයක් ඉක්ම යාමට ප්‍රථමයෙන් අදාළ නඩු පැවරීම කළ යුතු වේ.
- මේ සම්බන්ධයෙන් වන විධිවිධාන මහ නගර සභා ආඥා පනතේ 308 වන වගන්තිය මගින් ද, නගර සභා ආඥා පනතේ 219 වන වගන්තිය මගින් ද, ප්‍රාදේශීය සභා පනතේ 213 වන වගන්තිය මගින් ද සලසා දී ඇත.

## පළාත් පාලනයට අදාළ ප්‍රධාන නීති, රීති රෙගුලාසි සහ නියෝගයන්ට අමතරව සෘජුව හා වක්‍රව බලපෑමක් ඇති වෙනත් නීතී

පළාත් පාලනයට අදාළ ප්‍රධාන නීති, රීති රෙගුලාසි සහ නියෝගයන්ට අමතරව සෘජුව හා වක්‍රව බලපෑමක් ඇති වෙනත් නීතීන් 100 කට අධික ප්‍රමාණයක් ඇති අතර, ඉන්සෘ ජුවම පළාත් පාලනයට අදාළ අනපනත් කීපයක් පහත දැක්වේ.

- 1862 අංක 15 දරන පීඩා ආඥා පනත
- 1893 අංක 7 දරන ජලභීතිකා රෝග ආඥා පනත
- 1893 අංක 9 දරන ගෝ ඝාතක ආඥා පනත
- 1899 අංක 9 දරන සුසානභූමි හා ශ්‍රමදාන ආඥා පනත
- 1946 අංක 12 දරන විනෝද බදු ආඥා පනත
- 1982 අංක 43 දරණ මුද්දර ගාස්තු පනත

## පළාත් පාලනයට අදාළ වන පූර්වාදර්ශ නඩු තීන්දු

**පළාත් පාලනයට වැදගත් වන්නා වූ පූර්වාදර්ශ නඩු තීන්දු කීපයක් පහත දැක් වේ.**

- නීතිපති එදිරිව ඩබ්ලිව්. එම්.ප්‍රනාන්දු - 79 නනීවා 39
- පෙරේරා එදිරිව ප්‍රනාන්දු - 17 නනීවා 494
- සෞඛ්‍ය පරීක්ෂක එදිරිව හරමාණිස් - 19 නනීවා 339
- ප්‍රනාන්දු එදිරිව රත්නායක - 75 නනීවා 543
- වැලිගම නගර සභාව එදිරිව අයි.එල්.එම්.අෂ්රෆ් - 66 නනීවා 41
- තාජුජීන් එදිරිව ගුණසේකර - 76 නනීවා 133
- සීමාසහිත ක්‍රෙස්ට් ජේම්ස් එදිරිව කොළඹ මහා නගර සභාව (2003) - 1 ශ්‍රීලංනීවා 370
- යාපනය මහා නගර සභාව එදිරිව පෙරුමෙයිනාත් - 66 නනීවා 327

- ටී.ඕ.ඩී.ජාන්සෙන් එදිරිව දෙහිවල ගල්කිස්ස නගර සභාව - 56 නනීවා 445
- සොයිසා එදිරිව කොළඹ මහා නගර සභාව - 20 නනීවා 152
- ගුණසේකර එදිරිව නාගරික ආදායම් පරීක්ෂක - 53 නනීවා 229
- සිල්වා එදිරිව කුරුණෑගල සමූපකාර සමිතිය - 57 නනීවා 430







# ශ්‍රී ලංකාවේ පළාත් පාලන පද්ධතියේ ආරම්භය හා විකාශය

## ශ්‍රී ලංකාවේ පළාත් පාලන ඉතිහාසය

ශ්‍රී ලංකාවේ පහළ ම ස්ථරයට අයත් වන දේශපාලන ආයතනය පළාත් පාලන ආයතන වේ. පළාත් පාලන ආයතන නොමැති ව සෘජුව ආණ්ඩුව යටතේ පාලනය වන පුරවර නීර්ණය කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලය ඇත. එසේ වුව ද වර්තමානයේ ශ්‍රී ලංකාවේ සියලු ම ගොඩ බිම් ප්‍රදේශ පළාත් පාලන ආයතනවලට අයත් ය.

ශ්‍රී ලංකාවේ පළාත් පාලනයට පුරාතන හා මධ්‍යතන යුග දක්වා දිව යන දීර්ඝ ඉතිහාසයක් ඇත. ක්‍රිස්තු පූර්ව 4 සියවසෙහි පණ්ඩුකාභය රජතුමාගේ කාලයෙහි අනුරාධපුර නගරය පිහිටුවීමේ දී පළාත් පාලන ක්‍රමයක් පැවති බවට ඓතිහාසික සාධක ඇත. පැරණි සෙල්ලිපිවල එවකට තිබූ ගම් සභා සහ නාගරික පාලන ක්‍රම ගැන තොරතුරු දක්වා ඇත. මහනුවර සහ කෝට්ටේ රාජධානි සමයෙහි ද ගම් සභාව පැවති බවට රාජසිංහ රජුගේ මල්වාන ගිවිසුමෙහි හා රොබට් නොක්ස්ගේ ලංකාව ගැන ලියූ ග්‍රන්ථයේ සඳහන් වේ.

1915 දී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට ලංකාව යටත් වූ පසු 1818 දී පැරණි ගම් සභා ක්‍රමය අහෝසි කරන ලදී. 1856 දී ඉංග්‍රීසි ආණ්ඩුව විසින් ඇල වේලි හා වාරිමාර්ග පරිපාලනය සඳහා ගම් සභාව නැවත පිහිටු වන ලදී. 1871 දී වැඩි බලතල සහිත ව නව ගම් සභා ක්‍රමයක් ඇති කරන ලදී. 1980 අංක 35 දරන දිස්ත්‍රික් සංවර්ධන සභා පනත මගින් දිස්ත්‍රික් සංවර්ධන සභා ඇති කිරීමත් සමග එතෙක් පැවති ගම් සභා 549 හා සුළු නගර සභා 83 අහෝසි කරන ලදී. 1987 දී මුලින් පැවති ගම් සභා සහ සුළු නගර සභා ප්‍රදේශ ඇතුළත් වන පරිදි ප්‍රාදේශීය සභා නමින් නැවත වැඩි බලතල සහිත ව පිහිටු වන ලදී.

## ශ්‍රී ලංකාවේ නූතන පළාත් පාලන ඉතිහාසය

නූතන පළාත් පාලනය 1856 සිට කුඩා පරිමාණයේ පළාත් පාලන ආයතන බිහි කරමින් වර්ධනය විය. බ්‍රිතාන්‍ය පාලන යුගයේ පනවන ලද ආඥා පනත්, පළාත් පාලන ආයතන බිහි වීමට මෙන් ම ඒවායේ ක්‍රමික විකාශයට ද බල පෑවේ ය.

බ්‍රිතාන්‍ය පාලන යුගයේ නිකුත් කරන ලද පළාත් පාලන ආයතන සම්බන්ධ ආඥා පනත් කිහිපයක් හා එමගින් පිහිටු වන ලද පළාත් පාලන ආයතන පහත දැක්වේ.

- 1865 අංක 17 දරන මහා නගර සභා ආඥා පනත යටතේ 1865 දී කොළඹ මහා නගර සභාව පිහිටු වීම. (ඒ සමග මෙරට නූතන පළාත් පාලනය ආරම්භ විය.)
- 1865 අංක 17 දරන මහා නගර සභා ආඥා පනත යටතේ 1866 දී නුවර මහා නගර සභාව පිහිටු වීම.
- 1865 අංක 17 දරන මහා නගර සභා ආඥා පනත යටතේ 1866.11.24 දිනැති ගැසට් පත්‍රය ප්‍රකාර ව 1867.01.01 දින සිට ගාල්ල මහා නගර සභාව පිහිටු වීම.







- ක්‍රි. ව. 1871 අංක 26 දරන ගම් කාර්ය සභා ආඥා පනත මගින් 1871 ගම් කාර්ය සභා පිහිටු වීම
- ක්‍රි. ව. 1939 අංක 61 දරන නගර සභා ආඥා පනත මගින් 1940 දී නගර සභා පිහිටු වීම
- 1946 අංක 03 දරන සුළු නගර සභා පනත මගින් 1946 දී සුළු නගර සභා පිහිටු වීම

1948 වර්ෂයේ දී ශ්‍රී ලංකාවට නිදහස ලැබෙන තෙක් ම පැවතියේ කොළඹ, නුවර හා ගාල්ල මහා නගර සභා තුන පමණි. අනෙකුත් මහා නගර සභා පසු කාලීන ව ඇති විය.

**1948 වසරේ දී ලංකාව බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලබන විට දිවයිනෙහි සිව් වැදෑරුම් පළාත් පාලන ආයතන ව්‍යුහයක් පැවතුණි**

- මහා නගර සභා
- නගර සභා
- සුළු නගර සභා
- ගම් සභා

එතැන් පටන් ක්‍රමානුකූල ව වර්ධනය වූ පළාත් පාලන ආයතන පද්ධතිය 20 වන සියවසේ මුල් භාගයේ දී යළිත් ප්‍රබල පරිවර්තනයකට යොමු විය. ඊට මුල් වූයේ 1931 වර්ෂයේ සිට ඩොනමෝර් කොමිෂන් සභා නිර්දේශ ක්‍රියාත්මක වීම යි.

### පළාත් පාලනයේ පෙරළියක් ඇති කළ ඩොනමෝර් කොමිෂන් සභා නිර්දේශවල ප්‍රතිඵල

- පළාත් පාලන පරිපාලනය සඳහා විධායක කාරක සභාවක් පත් කිරීම,
- පළාත් පාලන දෙපාර්තමේන්තුව බිහි වීම,
- ඒකීය පළාත් පාලන ආයතන පද්ධතිය නිර්මාණය වීම හා
- පළාත් පාලන සේවාව ආරම්භ වීම

### ලංකාවේ පළාත් පාලන ආයතන ව්‍යුහය සැකසීමේ ප්‍රධාන නිර්ණායක

- ලංකාවේ ඉතා දියුණු නාගරික ලක්ෂණ, ජනගහන ඝනත්වය සහ ආදායම ආදී කරුණු වලින් ප්‍රමුඛ වූ නගර, මහා නගර සභා (Municipal Councils) විය.
- මධ්‍යම ප්‍රමාණයේ නාගරික ලක්ෂණ ඇති නගර, නගර සභා (Urban Councils) විය.
- කුඩා නගර, සුළු නගර සභා (Town Councils) විය.
- ග්‍රාමීය ප්‍රදේශ, ගම් සභා (Village Councils) විය.

### ප්‍රාදේශීය සභාවල ආරම්භය

ඉහත කී වර්ගීකරණය සහිත පළාත් පාලන ආයතන ව්‍යුහය 1980 දක්වා දශක පහක පමණ කාලයක් පැවතුණි. 1980 අංක 35 දරන දිස්ත්‍රික් සංවර්ධන සභා පනත මගින් දිස්ත්‍රික් සංවර්ධන සභා ඇති කිරීමත් සමග එතෙක් පැවති ගම් සභා 549 හා සුළු නගර සභා 83 අහෝසි කරන ලදී. එම ආයතන සතු පළාත් පාලන කාර්ය භාරය දිස්ත්‍රික් සංවර්ධන සභා වෙත පවරන ලදී.

නැවත 1987 දී, එවකට පැවති රජය විසින් දිස්ත්‍රික් සංවර්ධන සභා අහෝසි කොට මුලින් පැවති ගම් සභා සහ සුළු නගර සභා ප්‍රදේශ ඇතුළත් වන පරිදි ප්‍රාදේශීය සභා නමින් නව පළාත් පාලන ආයතනයක් 1987.04.16 දින සිට බලපවත්වන පරිදි ඇති කරන ලදී. පළාත් පාලන ව්‍යුහයේ තුන් වන ස්තරය ප්‍රාදේශීය සභා වේ. මේ යටතේ පළමු පළාත් පාලන මැතිවරණය 1991.05.11 දින පවත්වන ලදී. 1987 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය මඟින් ප්‍රාදේශීය සභා, පළාත් සභා යටතේ බලය පැවරුණු විෂයයක් බවට පත් විය.

සංස්ථාපිත මෙම ආයතන සියල්ලක් ම එයට අනන්‍ය වූ බලතල හා කාර්යයන් සහිත රාජ්‍ය සංස්ථා වේ. පළාත් පාලන ව්‍යුහය තුළ ඉහළතම පළාත් පාලන ආයතනය මහනගර සභා වන අතර දෙවැන්න නගර සභා ද තුන්වැන්න ප්‍රාදේශීය සභා ද වේ.

## 2024 දී ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන ව්‍යුහය හා සංඛ්‍යාව

ශ්‍රී ලංකාවේ මෑත කාලීන ව සිදු වූ සමාජ, ආර්ථික හා දේශපාලනික වෙනස්කම් හේතු කොට ගෙන මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා අලුතින් ඇති කිරීම සඳහා ඉල්ලුමක් ඇති විය.

ඒ අනුව මේ වන විට (2024) ශ්‍රී ලංකාවේ පවතින පළාත් පාලන ආයතන සංඛ්‍යාව මෙසේ ය.

- මහා නගර සභා 24
- නගර සභා 41
- ප්‍රාදේශීය සභා 276

**එකතුව 341**

## පළාත් පාලන ආයතනවලට අයත් මූලික කර්තව්‍යයන්

ප්‍රදේශවල ජනතාවගේ පහසුව,සුබවිහරණය හා යහපැවැත්ම වෙනුවෙන් පිහිට වූ පළාත් පාලන ආයතන විසින් පහත සේවාවන් ක්‍රියාත්මක කරයි.

- මහජන උපයෝගීතා සේවා
- පරිපාලන හා නියාමන සේවා
- මහජන සෞඛ්‍යය හා සනීපාරක්ෂාව ප්‍රවර්ධනය
- පාරිසරික ආරක්ෂාව
- පොදු මංමාවත් සහ පොදු සැපයුම් සේවා පවත්වා ගෙන යාම.
- සුබ සාධන කටයුතු





## පළාත් පාලන ආයතනවල සංයුතිය

සෑම පළාත් පාලන ආයතනයක් ම නෛතික පුද්ගලයෙකි. එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇත. තම ආයතනය නමින් නඩු පැවරීමට සහ නඩු පැවරීමකට භාජනය වීමට ද හැකියාව පවතී. ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට කරුණු ලැබූ 13 වන සංශෝධනය මගින් පළාත් පාල නය පිළිබඳ බලතල පළාත් සභාවලට පවරා ඇත. එසේ වුවත් පළාත් පාලන ආයතනවල ව්‍යුහය හා සංයුතිය තීරණය කිරීම පිළිබඳ බලය, මධ්‍යම රජයේ අදාළ විෂය භාර අමාත්‍යවරයා වෙත පවරා ඇත.

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන (මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා) ජනතාව විසින් තෝරා පත් කර ගනු ලබන මහජන නියෝජිතයන්ගෙන් සමන්විත වේ. පළාත් පාලන ආයතනවලට පැවරී ඇති වගකීම් ඉටු කිරීමෙහි ලා පළාත් පාලන ආයතනයනවල ඇති ඉහළ ම බල මණ්ඩලය වන්නේ 'සභාව' වේ. පළාත් පාලන ආයතනයක ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලබන්නේ 'සභාව' විසින් වීම එයට හේතුව වේ. පළාත් පාලන ආයතනයක් යනු ජනතාවගේ ආයතනයකි. එහි කටයුතු කාර්යක්ෂමව ඵලදායි ව සහ යහපත් ව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබා දීමට ජනතාව විසින් තෝරා පත් කර ගනු ලැබූ මහජන නියෝජිතයින් බැඳී සිටි.


මහ නගර සභාවක, එහි ව්‍යාප්තිය හා ජනගහනය සැලකිල්ලට ගෙන විෂය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරණු ලබන මහජන නියෝජිතයින් සංඛ්‍යාවක් තෝරා පත් කර ගනු ලැබේ. ඔවුන් අතරින් නගරාධිපති හා නියෝජ්‍ය නගරාධිපති තෝරා පත් කර ගනු ලැබේ.

නගර සභාවක එහි ව්‍යාප්තිය හා ජනගහනය සැලකිල්ලට ගෙන විෂය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරණු ලබන මහජන නියෝජිතයින් සංඛ්‍යාවක් තෝරා පත් කර ගනු ලැබේ. ඔවුන් අතරින් සභාපති හා උප සභාපති තෝරා පත් කර ගනු ලැබේ.

ප්‍රාදේශීය සභාවක එහි ව්‍යාප්තිය හා ජනගහනය සැලකිල්ලට ගෙන විෂය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරණු ලබන මහජන නියෝජිතයින් සංඛ්‍යාවක් තෝරා පත් කර ගනු ලැබේ. ඔවුන් අතරින් සභාපති හා උප සභාපති තෝරා පත් කර ගනු ලැබේ.

## සභිකයින්ගේ ධුර කාලය

පළාත් පාලන ආයතනවලට අදාළ නීති මගින් මේ කාල සීමාව මාස හතළිස් අටක් (අවුරුදු 4ක්) වශයෙන් නියම කරනු ලැබ ඇත. එහෙත් විෂය භාර අමාත්‍යවරයාට උපරිම වර්ෂයක කාලයකට යටත් ව ධුර කාලය අඩු කිරීමට හෝ වැඩි කිරීමට හැකියාව තිබේ. සභාවක සාමාන්‍ය රැස්වීම් මසකට එකක් පැවැත්වෙන අතර විශේෂ රැස්වීම් අවශ්‍යතාව අනුව පැවැත් වේ.







## සභිකවරුන් අසුන් ගත යුතු පිළිවෙළ

මහා සභා රැස්වීමක දී සභිකවරුන් අසුන් ගත යුත්තේ සභිකයින්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙළට ය. එම ප්‍රමුඛත්ව අනුපිළිවෙළ මෙසේය.

- නගරාධිපති/සභාපති
- නියෝජ්‍ය නගරාධිපති/උප සභාපති
- නැවත තෝරාපත් කරගනු ලැබූ හිටපු සභිකයින්, ඔවුන්ගේ අඛණ්ඩ සාමාජිකත්වය අනුපිළිවෙළ අනුව
- අනෙකුත් සභිකයන්, ඔවුන් තෝරා පත් කර ගැනීම පිළිබඳව මැතිවරණ කොමසාරිස්වරයාගේ ප්‍රකාශයෙහි ඇති ප්‍රමුඛත්ව අනුපිළිවෙල අනුව

## පළාත් පාලනය සම්බන්ධයෙන් පළාත් සභාවට පැවරෙන බලතල

පළාත තුළ පිහිටි පළාත් පාලන ආයතන කටයුතු අධීක්ෂණයට, පාලනයට හා විසුරුවා හැරීමට බලය පළාත් සභාවට පැවරී ඇත. මේ සඳහා ආණ්ඩුකාරවරයා, අමාත්‍යවරයා, පළාත් පාලන කොමසාරිස්වරයා, සහකාර කොමසාරිස්වරයා සහ වෙනත් රජයේ නිලධාරීන්ගේ සේවය ලබා ගැනේ.

## වර්තමානයේ පළාත් පාලන ආයතන මුහුණ දී ඇති ගැටලු

- නගර සභා හා මහා නගර සභා නීතියෙහි ඇති විධිවිධාන යල් පැන ගිය ඒවා වීම.
- උදා:
  - නාගරික මහේස්ත්‍රාත් ධුරය,
  - සමහර වැරදි සම්බන්ධයෙන් පනවා ඇති දඩ මුදල් ප්‍රමාණවත් නො වීම.
- සිවිල් පුරවැසියන් සහභාගීත්ව පාලන ක්‍රියාදාමයට කාරක සභා ක්‍රමය හරහා සම්බන්ධ කර නො ගැනීම.
- සිවිල් පුරවැසියන්, සහභාගීත්ව සැලසුම්කරණයට හා අයවැයකරණයට සහභාගී කර නො ගැනීම.
- ක්‍රියාත්මක කිරීමට මුදල් අවශ්‍ය නො වන කාරණා ද ඉටු නො කර සිටීම.
  - උදා: අපවිත්‍ර ජලය හා කැළිකසල පොදු මංමාවත්වලට හා ජලාපවහන මාර්ගවලට බැහැර කිරීම වැළැක්වීමට කටයුතු නො කිරීම
- නිර්මාණශීලී නො වීම, ප්‍රයෝජනයට ගත හැකි අවස්ථා මග හැරීම, හා ආදායම් උත්පාදන මාර්ග කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු නො කිරීම.
- සේවා සැපයීමේ දී තොරතුරු තාක්ෂණය යොදා ගැනීමට මැලි බවක් දැක් වීම.
- සේවා සැපයීමේ දී ඩිජිටල් වේදිකා යොදා ගැනීමට මැලි බවක් දැක් වීම.
- සභා රැස්වීම්වල මහජන ගැලරි සහභාගිත්වය පුළුල් කිරීමට මැලි බවක් දැක් වීම.

- පළාත් පාලන විෂය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා පුහුණුවක් ඇති නිලධාරීන්ට ස්ථාන මාරු හා විෂය මාරු ලබා දීම.
- පළාත් පාලන විෂය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා පුහුණුවක් නැති නිලධාරීන් පළාත් පාලන ආයතනවල ඉහළ තනතුරුවලට පත් කිරීම.
- පළාත් පාලන ආයතනවල කාර්යමණ්ඩලයට පළාත් පාලන විෂය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා පුහුණුවක් නො මැති කම.
- සහායක ආයතන සමග සමීප සබඳතාවක් පවත්වා නො ගැනීම.
- පළමු හා දෙවන පාලන ස්තර (මධ්‍යම රජය හා පළාත් සභා) සමග නිරන්තර මත ගැටුම් පැවතීම.
- පළාත් පාලන නියෝජිතයින්ගේ මූලික වගකීම ඇත්තේ රජයට, පළාත් සභාවට හෝ තමන් නියෝජනය කරන දේශපාලන පක්ෂයට නොව තමන් තෝරා පත් කර ගනු ලැබූ මහජනතාවට ය. එහෙත් වර්තමානයේ පළාත් පාලන නියෝජිතයින් මෙය අමතක කර තමන් නියෝජනය කරන දේශපාලන පක්ෂයට පමණක් වග කියන තත්ත්වයට පත් වීම.
- පළාත් පාලන නීතියෙහි පක්ෂ විපක්ෂ බෙදීමක් නැති වුව ද වර්තමානයේ ආණ්ඩු පක්ෂය හා විපක්ෂය යනුවෙන් බෙදීමක් තිබීම.
- මහා සභා රැස්වීමක් පැවැත් වීමට බොහෝ පළාත් පාලන ආයතන පැය 06කට වැඩි කාලයක් ගැනීම හා එය නූතන වැඩ ලෝකයට නො ගැළපීම.

## වර්තමානයේ පළාත් පාලන ආයතන මුහුණ දී ඇති ගැටලු අවම කර ගැනීම සඳහා යෝජිත උපාය මාර්ග

- පළාත් පාලන ආයතනවල යල් පැන ගිය නීති සංශෝධනය සඳහා අතුරු ව්‍යවස්ථා සැකසීම
- පළාත් පාලන ආයතනවල මාසික මහා සභා රැස්වීමේ කාරක සභා අවස්ථාවේ දී හා කමිටුවල දී ජනතාවට ද සහභාගී වී අදහස් දැක්වීමට අවස්ථාවක් ලබා දීමේ ක්‍රමවේදය අතුරු ව්‍යවස්ථාවලට ඇතුළත් කිරීම.
- පළාත් පාලනයේ දී සහභාගිත්ව සැලසුම්කරණය හා සහභාගිත්ව අයවැයකරණය සඳහා ප්‍රජා මූල සංවිධාන සහභාගීත්වය ලබා ගැනීමේ ක්‍රමවේදය අතුරු ව්‍යවස්ථාවලට ඇතුළත් කිරීම.
- සභා රැස්වීම්වල මහජන ගැලරි සහභාගිත්වය පුළුල් කිරීමේ ක්‍රමවේදය අතුරු ව්‍යවස්ථාවලට ඇතුළත් කිරීම.
- පළාත් පාලන බල ප්‍රදේශ තුළ ප්‍රජා මණ්ඩල හා ප්‍රජා සංවර්ධන සමිතිපිහිටුවීම හා ඒ මගින් ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීමේ ක්‍රමවේදය අතුරු ව්‍යවස්ථාවලට ඇතුළත් කිරීම.
- පළාත් පාලන බල ප්‍රදේශ තුළ ප්‍රජා මණ්ඩල හා ප්‍රජා සංවර්ධන සමිති මගින් ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීමේ දී ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගේ සහාය ලබා ගැනීමේ ක්‍රමවේදය අතුරු ව්‍යවස්ථාවලට ඇතුළත් කිරීම.

- ඊ- සභා ජංගම දුරකථන යෙදවුම සඳහා නෛතික බලයක් ලබා දීමේ ක්‍රමවේදය අතුරු ව්‍යවස්ථාවලට ඇතුළත් කිරීම.
- පළාත් පාලන ආයතනවල නිලධාරීන් සඳහා ස්ථාන මාරු හා විෂය මාරු ලබා දීමේ පිළිගත් ක්‍රමවේදයක් සැකසීම.
- පළාත් පාලන ආයතනවල නිලධාරීන් හා සභිකයින් සඳහා පළාත් පාලන නීතිය පිළිබඳ අඛණ්ඩ පුහුණුවක් ලබා දීමේ ක්‍රමවේදයක් සැකසීම.
- පළාත් පාලන ආයතනවල නිලධාරීන් හා සභිකයින් සඳහා පළාත් පාලන විෂය පිළිබඳ උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීමේ ක්‍රමවේදයක් සැකසීම. (උදා: පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා)







# පළාත් පාලනයේ දී සක්‍රිය පුරවැසි සහභාගීත්වය

## පුරවැසි සහභාගීත්වය යනු කුමක් ද?

පුද්ගලයකුගේ පිළිසිඳ ගැනීමේ සිට සුසාන භූමිය දක්වා වූ කාල පරාසය තුළ ජීවත් වීමට අදාළ තම දෛනික අවශ්‍යතා සපුරා ගැනීමේ ක්‍රියාවලිය පළාත් පාලන ආයතන මගින් සිදු වේ. මෙම ක්‍රියාවලිය නිසි පරිදි ක්‍රියාත්මක කර වීමේ වැදගත් ම මෙවලම් අතර පුරවැසි සහභාගීත්වයට වැදගත් තැනක් හිමි වේ.


පුරවැසි සහභාගීත්වය යනු, සභාවේ කටයුතුවලට ප්‍රදේශයේ ප්‍රජාව දක්වන සහභාගිත්වය, දායකත්වය හෝ හවුල්කාර බව යි. පුරවැසි සහභාගීත්වය යනු , පුරවැසියන් බල ගැන්වීම සඳහා උපයුක්ත කර ගත හැකි හොඳ ම ක්‍රමවේදය යි. පුරවැසි සහභාගීත්වය යනු, පළාත් පාලන ආයතනවල තීරණ ගැනීම සහ ඔවුන් ජීවත් වන ප්‍රජාවට බලපාන ප්‍රතිපත්ති ගොඩනැගීම කෙරෙහි සෘජු හෝ වක්‍ර බලපෑමක් ඇති කිරීමට පුරවැසියන්ට ඉඩ සලසන අපූර්වතම මෙවලම යි.

## පුරවැසි සහභාගීත්වයේ ප්‍රතිලාභ

පළාත් පාලන ආයතන විසින් කළ යුතු සංවර්ධන හා සේවා වැඩ සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රජා සහභාගිත්වය තුළින් වඩාත් කාර්යක්ෂම හා ඵලදායි ලෙස ඒවා ඉටු කළ හැකි වේ. පුරවැසියන් පොදු තීරණ ගැනීම සඳහා සහභාගී වන විට, රාජ්‍ය නිලධාරීන් කෙරෙහි ඉහළ මට්ටමේ පාලනයක් ජනනය වන අතර, එමගින් නාස්තිය හා දූෂණයෙන් තොර ව සභාවේ මුදල් පරිහරණය කළ හැකි වේ. සැබෑ ජනතා වුවමනාවන් ඉටු කළ හැකි වේ. පොදු මහජන සම්පත් ආරක්ෂා කළ හැකි වේ. නඩත්තු පිරිවැය අවම කළ හැකි වේ. රාජ්‍ය නිලධාරීන්ගේ අවධානයට ලක් නො වූ ගැටලු හඳුනා ගැනීමට පුරවැසි සහභාගීත්වය උපකාර වන අතර එය වඩාත් ඵලදායී හා කාර්යක්ෂම විසඳුම් සෙවීමට උපකාරී වේ.

රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය කිරීමේ දී හා පොදු තීරණ ගැනීමේ දී පුරවැසියන්ට සහභාගී වීමට අවස්ථාව ඇති විට, ඔවුන්ගේ අවශ්‍යතා සහ අදහස් සැලකිල්ලට ගන්නා බව සහතික කරයි. සමාජ වගකීම, විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කරයි. පුරවැසි සහභාගීත්වය රාජ්‍ය කළමනාකරණයේ විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම සඳහා වටිනා මෙවලමකි. පුරවැසියන්ට ඔවුන්ගේ දැනුම සහ අත්දැකීම් බෙදා ගැනීමට ඉඩ දීමෙන් රාජ්‍ය ප්‍රතිපත්තිවල ගුණාත්මක භාවය වැඩි දියුණු වේ.

විවිධ පසුබිම්වලින් සහ දෘෂ්ටිකෝණවලින් යුතු පුරවැසියන්ට පොදු තීරණ ගැනීමේ දී එකට වැඩ කිරීමට ඉඩ සලසන බැවින් පුරවැසි සහභාගීත්වය සමාජ සහජීවනය, සමාජ ඒකාබද්ධතාව, සහ ප්‍රජාතන්ත්‍රවාදී සහභාගිත්වය ද පෝෂණය කරයි. ශක්තිමත්, ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රජාවන් ගොඩ නැගිය හැකි වේ. පුරවැසි සහභාගීත්වය සමාජයේ විවිධ කණ්ඩායම් අතර පාලම් ගොඩනැගීමට සහ පොදුවේ ප්‍රජාතන්ත්‍රවාදී සහභාගීත්වය පෝෂණය කිරීමට උපකාරී වේ.




## පුරවැසි සහභාගීත්වය ලබා ගැනීම සඳහා පළාත් පාලන ආයතනයකට අනුගමනය කළ හැකි උපාය මාර්ග

### 01. සභාවේ උපදේශන කාරක සභාවලට ප්‍රදේශයේ පුරවැසියන් පත් කිරීම

පළාත් පාලන ආයතන වලට පත් කරන උපදේශන කාරක සභාවලට පුරවැසියන් පත් කිරීමෙන් තීරණ ගැනීමේ ක්‍රියාවලියට මහජන සහභාගීත්වය ලබාගත හැකි ය. ඒ ඒ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන් හා අත් දැකීම් බහුල ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උපදේශන කාරක සභාවලට පත් කිරීමෙන් පළාත් පාලන ආයතනවල මානව හා විශේෂඥ ශක්තිය වැඩි වේ. උදා: කර්මාන්ත කමිටුවට ඉංජිනේරුවන් හා සෞඛ්‍ය කමිටුවට විශේෂඥ වෛද්‍යවරුන් සිවිල් පුරවැසියන් අතරින් පත් කර ගැනීම

### 02. අයවැය යෝජනා සැකසීමේ ක්‍රියාවලියට පුරවැසියන් සහභාගී කර ගැනීම

ඉදිරි වර්ෂය සඳහා අයවැය යෝජනා සකස් කිරීමේ දී හා අයවැය කෙටුම්පත් සාකච්ඡාවේ දී ජනතා සහභාගීත්වය ලබා ගැනීමට පනත් හා රීතිවලින් විධි විධාන සලසා තිබේ. මෙහි දී ප්‍රජාව දැනුවත් කර සංවර්ධන හා ආදායම් වියදම් යෝජනා ගැන මහජන අදහස් ලබා ගත හැකි ය.

### 03. සංවර්ධන සැලසුම් සැකසීමේ දී හා සේවා සැපයීමේ දී පුරවැසියන්ගේ සහභාගිත්වය ලබා ගැනීම

උදා: වාර්ෂික අයවැයෙන් කොටසක් වෙන් කර දිගු කාලීන, මධ්‍ය කාලීන හා කෙටි කාලීන සංවර්ධන සැලසුම් සැකසීමේ දී මහජන අදහස් හා යෝජනා ලබා ගැනීම, සේවා සැපයීමේ දී ප්‍රජා දායකත්වය ලබා ගැනීම, සේවා සැපයීමේ දී ප්‍රජා මූලික සංවිධාන සහාය ලබා ගැනීම, කොට්ඨාස මට්ටමින් මහජන රැස්වීම් පවත්වා මහජන අදහස් ලබා ගැනීම, බල ප්‍රදේශය තුළ සිදු කෙරෙන සංවර්ධන කටයුතු වල ප්‍රගතිය අධීක්ෂණයේ වගකීම ප්‍රජාවට පැවරීම සහ පාලම් බෝක්කු ආදිය ප්‍රමිතියට ඉදි කරන්නේ ද යන්න අධීක්ෂණයේ වගකීම ප්‍රජාවට පැවරීම. (උදා: යොදා ගන්නා කොන්ක්‍රීට් මිශ්‍රණයේ අනුපාතවල ප්‍රමිතිය අධීක්ෂණය, යොදා ගන්නා කොන්ක්‍රීට් ගල්වල ප්‍රමිතිය අධීක්ෂණය සහ යොදා ගන්නා වැලිවල ප්‍රමිතිය (මඩ නැති ගඟේ වැලි) අධීක්ෂණය සහ යොදා ගන්නා යකඩවල ප්‍රමිතිය අධීක්ෂණය)

### 04. සභා රැස්වීම්වල මහජන ගැලරි සහභාගිත්වය පුළුල් කිරීම සඳහා පියවර ගැනීම

- විධිමත් හා විවෘත ලෙස සභා රැස්වීම් පැවැත් වීම.
- මහජන ගැලරිවල පහසුකම් වැඩි කිරීම.
- මහජන ගැලරිවලට පැමිණීම දිරිමත් කිරීම.
- සභා රැස්වීම් ආවරණය සඳහා මාධ්‍යවේදීන් දිරිමත් කිරීම.
- කාරක සභා අවස්ථාවල දී ප්‍රජාවට අදහස්, යෝජනා හා පැමිණිලි ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම.
- පළාත් පාලන කටයුතු සඳහා සුවිශේෂී දායකත්වයක් ලබා දුන් පුරවැසියන් කාරක සභා අවස්ථාවට ගෙන්වා ඇගයීම.

**05. මහජන මත විමසීම් සහ පුරවැසි උපදේශන අවස්ථා සලසා දීම**

කිසියම් නව ව්‍යාපෘතියක් ආරම්භ කිරීමේ දී හා බලපෑම් ඇගයීමේ දී පුරවැසියන්ට තම අදහස් සහ යෝජනා ප්‍රකාශ කිරීමට අවස්ථා සලසා දිය යුතු ය.

**06. පැමිණිලි හෝ යෝජනා ඉදිරිපත් කිරීමට පුරවැසියන්ට ඉඩ සලසා දීම**

සේවාවන් ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා හෝ රාජ්‍ය නිලධාරීන්ගේ හැසිරීම පිළිබඳ දුර්වලතා ගැන පැමිණිලි හෝ යෝජනා ඉදිරිපත් කිරීමට පුරවැසියන්ට ඉඩ සලසන ක්‍රමවේදයක් සලසා දිය යුතු ය. මෙම ක්‍රමවේදය මුහුණට මුහුණ හෝ මාර්ග ගත විය හැකි ය. ලිඛිත හෝ අලිඛිත විය හැකි ය.

**07. පුරවැසි සහභාගීත්වය ලබා ගැනීම සඳහා ඩිජිටල් වේදිකා තනා දීම**

පුරවැසියන්ට, බලධාරීන් සහ අනෙකුත් පුරවැසියන් සමඟ අන්තර් ක්‍රියා කිරීමට ඉඩ සලසන මෙවලම් වේ. ඒවාට සාකච්ඡා, සමීක්ෂණ, පුරවැසි පෙත්සම් සහ වෙනත් සහභාගීත්ව ක්‍රමවේද ඇතුළත් විය හැකි ය. එක් උදාහරණයක් වන්නේ විවිධ උපකාරක සේවා සපයන e-Shaba ඩිජිටල් වේදිකාවයි.

**08. පුරවැසි සහභාගීත්වය ලබා ගැනීම සඳහා වූ විධික්‍රම අණපනත්වලට ඇතුළත් කිරීම**

මෙරට පළාත් පාලනයට අදාළ පනත්වල එහෙත් ඍජු ව නොව වක්‍ර ව පුරවැසි සහභාගීත්වයට අනුබල දී ඇත. ජනතා සහභාගිත්වය ලබා ගැනීම සඳහා වූ විධික්‍රම අන්තර්ගත කොට නැත. නීතියෙන් බැඳී නැති නමුත් ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන කීපයක් ම පුරවැසි සහභාගීත්වය ලබා ගැනීම සඳහා තමන්ට ආවේණික විධික්‍රම භාවිතයට ගෙන ඇත.

**09. කමිටු ක්‍රමය වැඩි දියුණු කිරීම**

පළාත් පාලන ආයතනවල කමිටු ක්‍රමය ස්ථාපිත කර ඇත්තේ ඒවායේ කාර්යභාරය පහසු කරලීම හා අදාළ කරුණු වඩාත් ගැඹුරින් සලකා බලා නිර්දේශ ඉදිරිපත් කරමින් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සභාවට මග පෙන්වීමට ය. මහා නගර සභා ආඥා පනතට අනුව කමිටු පිහිටු විය හැක්කේ නියෝජිතයින් අතරින් පමණි. එසේ වුවත් නගර සභා හා ප්‍රාදේශීය සභාවලට ප්‍රදේශයේ ජනතා නියෝජිතයන්ගෙන් හා සිවිල් පුරවැසියන්ගෙන් සමන්විත වන කමිටු සකසා ගැනීමට බලය පවරා දී ඇත.

## පළාත් පාලන ආයතනවල කමිටු ක්‍රමය ස්ථාපිත කිරීමට අදාළ ව්‍යවස්ථාපිත නීතියේ ඇති බලතල

### මහා නගර සභා ආඥා පනත හා අතුරු ව්‍යවස්ථාවන්ට අනුව කමිටු පිහිටු වීමට ඇති බලතල

මහා නගර සභා ආඥා පනතේ 26 වගන්තිය යටතේ ස්ථාවර කමිටු හා උපදේශන කමිටු පත් කිරීමට උපදෙස් දී ඇත. ඒ අනුව ස්ථාවර කමිටු පිහිටු විය හැක්කේ නියෝජිතයින් අතරින් පමණි. මහා නගර සභා කමිටුවලට බාහිර පුද්ගලයන් පත් කළ හැකි බවක් මහා නගර සභා ආඥා පනතේ සඳහන් නොවේ. එහෙත් ඍජු ව නොව වක්‍ර ව පුරවැසි සහභාගීත්වයට අනුබල දී ඇත.





**ගාල්ල මහා නගර සභාවේ පිහිටුවා ඇති ස්ථාවර කාරක සභා හා උපදේශන කමිටුඃ (2023.03.18 දිනට)**

- මුදල් පිළිබඳ ස්ථාවර කාරක සභාව
- කර්මාන්ත, නගර සංවර්ධන හා සැලසුම් සම්පාදනය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, විදුලිය හා ජලය පිළිබඳ ස්ථාවර කාරක සභාව
- සෞඛ්‍ය, සනීපාරක්ෂක කටයුතු හා වෙළඳසැල් පිළිබඳ ස්ථාවර කාරක සභාව
- නිවාස, ප්‍රජා සංවර්ධන, සේවක හා ළමා සුබසාධන කටයුතු පිළිබඳ ස්ථාවර කාරක සභාව
- පරිසර,උද්‍යාන ක්‍රීඩා හා සංස්කෘතික කටයුතු පිළිබඳ ස්ථාවර කාරක සභාව
- ටෙන්ඩර් මණ්ඩලය
- රථවාහන කමිටුව
- වීථි නම් කිරීමේ කමිටුව
- මහජනාධාර කමිටුව
- පුස්තකාල උපදේශන කමිටුව



## නගර සභා ආඥා පනත හා අතුරු ව්‍යවස්ථාවන්ට අනුව කමිටු පිහිටු වීමට ඇති බලතල

නගර සභා ආඥා පනතේ 29 වගන්තිය යටතේ ස්ථාවර කමිටු හා උපදේශන කමිටු පත් කිරීමට උපදෙස් දී ඇත. සෘජු ව පුරවැසි සහභාගීත්වයට අනුබල දී ඇත. ඒ අනුව, නගර සභාවක් විසින්, සභාවේ බලතල, කාර්ය හෝ වගකීම් හෝ සභාවේ සැලකිල්ලට භාජනය ව ඇති යම් කරුණක් සම්බන්ධයෙන් සභාවට උපදෙස් දීමේ කාර්යය සඳහා සභාවේ සභිකයන්ගෙන් ම සමන්විත වූ හෝ අඩක් සභාවේ සභිකයන්ගෙන් ද අඩක් නගරයේ සෙසු වැසියන්ගෙන් ද සමන්විත වූ කාරක සභා කලින් කල පත් කරනු ලැබිය හැකි අතර,

සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි උපදෙස්වලට සහ කොන්දේසිවලට යටත් ව, යම් ණයක් ලබා ගැනීමට හෝ යම් වරිපනම් ගාස්තුවක් පැනවීමට හෝ යම් බද්දක් අය කිරීමට හෝ බලය හැර, සභාවේ බලතල කිසිවක් හෝ කාර්යය කිසිවක් සභා විසින් එකී කාරක සභාවට කලින් කල පවරනු ලැබිය හැකි ය. (මුදල් බලතල ලබා දිය නො හැකි ය.)







## 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත හා අතුරු ව්‍යවස්ථාවන්ට අනුව කමිටු පිහිටු වීමට ඇති බලතල

1987 අංක15 දරන ප්‍රාදේශීය සභා පනත මඟින් ප්‍රාදේශීය මට්ටමින් පරිපාලන හා සංවර්ධන කටයුතුවලට අදාළ තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඵලදායී ලෙස සහභාගී වීමට ජනතාවට වැඩි අවස්ථාවන් සැලසී ඇත. ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීමේ විධික්‍රම ප්‍රාදේශීය සභා පනතේ සවිස්තර ව දක්වා නැතත් එහි පූර්විකාවෙහි පුරවැසි සහභාගීත්වයේ වැදගත් කම අවධාරණය කර ඇත.

## 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පූර්විකාව

පරිපාලන සහ සංවර්ධන කටයුතුවලට අදාළ ව තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි ජනතාවට පළාත් මට්ටමින් ඵලදායී ලෙස සහභාගි වීම සඳහා වැඩි අවස්ථා සලසා දීමේ අරමුණ ඇතිව, ප්‍රාදේශීය සභා පිහිටු වීම සඳහා ද එම සභාවල බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් නිශ්චය කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.


### ප්‍රාදේශීය සභා පනතේ 12 වගන්තිය යටතේ කමිටු පත් කිරීමට උපදෙස් දී ඇත.

12. (1) ප්‍රාදේශීය සභාවෙහි බලතල, කාර්යයන් සහ කර්තව්‍ය කිසිවකට හෝ සභාවෙහි සැලකිල්ලට භාජනය පවතින යම් කරුණකට හෝ අදාළ ව සභාවට උපදෙස් දීමේ කාර්ය සඳහා සභාවේ සභිකයන්ගෙන් හෝ කොටසක් සභිකයන්ගෙන් සහ කොටසක් ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් සහ ඒ ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පිහිටුවා ඇති ග්‍රාමෝදය මණ්ඩලවල සභාපතිවරුන්ගෙන් හෝ සමන්විත කාරක සභා, ප්‍රාදේශීය සභාවක් විසින් කලින් කල පත් කරනු ලැබිය හැකි අතර,

යම් ණයක් ලබා ගැනීමේ, යම් වරිපනම් බද්දක් පැනවීමේ හෝ යම් බද්දක් පැනවීමේ බලතල නොවන, සභාවේ බලතල හෝ කාර්යයන් කිසිවක් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි කොන්දේසි වලට යටත් ව කලින් කල එම කාරක සභා වෙත පවරනු ලැබිය හැකි ය. (මුදල් බලතල ලබා දිය නො හැකි ය.)

## පළාත් පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2012-2014 මඟින් පුරවැසියාට පවරා දී ඇති අයිතිවාසිකම්

සිවිල් සමාජය බලමුළු ගැන්වීම, සමාජ සහයෝගිතාව හා සහභාගීත්වය සහතික කිරීම, සහභාගීත්ව තීරණ ගැනීම සහ සහභාගීත්ව සංවර්ධනය අධීක්ෂණය කිරීම සඳහා ජන සභා කමිටු, කොට්ඨාස කමිටු හා මාර්ග මට්ටමේ සංවර්ධන කමිටු පිහිටු වීම. සහභාගීත්ව සැලසුම් සහ අයවැය ක්‍රියාවලීන්හි ප්‍රජා නියෝජනය සඳහා ආයතනික ක්‍රමවේදයක් හඳුන්වා දීම. ප්‍රාදේශීය දේශපාලනයේ කාන්තා, තරුණ සහ ආන්තික කණ්ඩායම්වල සමාජ අන්තර් කරණයේ මට්ටම සහ ගුණාත්මක භාවය තක්සේරු කිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තු මට්ටමින් කාලානුරූප සමාලෝචන ක්‍රමවේදයක් හඳුන්වා දීම.







## ව්‍යවස්ථාපිත නීති මගින් පළාත් පාලනයේ දී පුරවැසියාට පවරා දී ඇති අයිතිවාසිකම්

පළාත් පාලන ආයතනවල මූල්‍ය ක්‍රියා පටිපාටි අධීක්ෂණය කිරීම නොහොත් මහජන විගණනය, තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය, මංමාවත් අලුත් වැඩියා කිරීමේ දී අන්තරායකාරී ලෙස එහි නිලධරයන් හෝ කොන්ත්‍රාත් කරුවන් කටයුතු කිරීමෙන් වළක්වා ගැනීමේ අයිතිය, (නගර සභා ආඥා පනත 100 වන වගන්තිය) ප්‍රාදේශීය ආණ්ඩුවේ ප්‍රතිපත්ති නිර්මාණය කිරීමේ ක්‍රියාවලියට දායක වීමසහ තොරතුරු දැන ගැනීමේ පනත.

## හඬට ඉඩක් ව්‍යාපෘතිය යටතේ පළාත් පාලනයේ දී මහජන සහභාගීත්වය ලබා ගැනීම සඳහා ප්‍රජාව සවිබල ගැන්වීමේ උපාය මාර්ග

- පළාත් පාලනයේ දී සහභාගිත්ව සැලසුම්කරණය පිළිබඳව, සහභාගිත්ව අයවැයකරණය සඳහා ප්‍රජා මූල සංවිධාන සහභාගීත්වය ලබා ගැනීම පිළිබඳව සහ පළාත් පාලනයට අදාළ නීති රීති පිළිබඳව, ප්‍රජා මූල සංවිධාන සංසද 20හි සාමාජිකයින් සඳහා පුහුණු සැසි 20ක් පැවැත් වීම.
- ප්‍රජා විමර්ශකයින්ගේ සංසද 20හි සාමාජිකයින්ගේ ධාරිතා සංවර්ධනය සඳහා එක් දින පුහුණු වැඩ මුළුවක් පැවැත් වීම.
- මේ පිළිබඳ ව පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම පිණිස මාර්ගෝපදේශ පොත් 2,000ක් නිකුත් කිරීම.
- තොරතුරු දැන ගැනීමේ පනත හා ප්‍රජාවට ඉන් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව දකුණු පළාත් ප්‍රජා මූල සංවිධාන සංසදයේ සාමාජිකයන්ට හා දකුණු පළාත් ප්‍රජා විමර්ශකයින්ගේ සංසදයේ සාමාජිකයන්ට එක් දින පුහුණු වැඩ මුළුවක් පැවැත් වීම.

## හඬට ඉඩක් ව්‍යාපෘතිය යටතේ පළාත් පාලනයේ දී මහජන සහභාගීත්වය ලබා ගැනීම සඳහා පළාත් පාලන ප්‍රධානීන් සවිබල ගැන්වීමේ උපාය මාර්ග

- පළාත් පාලන ආයතනවල මාසික මහා සභා රැස්වීමේ කාරක සභා අවස්ථාවේ දී හා කමිටුවල දී ජනතාවට ද සහභාගී වී අදහස් දැක්වීමට අවස්ථාවක් ලබා දීමේ ක්‍රමවේදය අවබෝධ කර වීම සඳහා පළාත් පාලන ප්‍රධානීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත් වීම.
- පළාත් පාලනයේ දී සහභාගිත්ව සැලසුම්කරණය හා සහභාගිත්ව අයවැයකරණය සඳහා ප්‍රජා මූල සංවිධාන සහභාගීත්වය ලබා ගැනීමේ ක්‍රමවේදය අවබෝධ කරවීම පිණිස පළාත් පාලන ප්‍රධානීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත් වීම.
- පළාත් පාලන බල ප්‍රදේශ තුළ ප්‍රජා මණ්ඩල හා ප්‍රජා සංවර්ධන සමිති පිහිටුවීම හා ඒ මගින් ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීමේ ක්‍රමවේදය අවබෝධ කර වීම සඳහා පළාත් පාලන ප්‍රධානීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත් වීම.

- පළාත් පාලන බල ප්‍රදේශ තුළ ප්‍රජා මණ්ඩල හා ප්‍රජා සංවර්ධන සමිති මගින් ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීමේ දී ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගේ සහාය ලබා ගැනීමේ ක්‍රමවේදය අවබෝධ කර වීම සඳහා පළාත් පාලන ප්‍රධානීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත් වීම.
- ඊ-සභා ජංගම දුරකථන යෙදවුම ප්‍රජාවට හඳුන්වා දීම සඳහා යොදා ගත හැකි ක්‍රම වේද පිළිබඳ ව පළාත් පාලන කොමසාරිස් තුමා විසින් උපදෙස් මාලාවක් නිකුත් කිරීම. උදා: වරිපනම් බදු අය කර ගැනීම සඳහා වාර්ෂිකව සකසා පළාත් පාලන බල ප්‍රදේශයේ මහජනතාවට බෙදන තක්සේරු දැන්වීමේ පිටුපස ඊ-සභා ජංගම දුරකථන යෙදවුම පිළිබඳව කෙටි පණිවුඩයක් යෙදීම.
- කෙටුම් පත් කිරීමට යෝජිත අතුරු ව්‍යවස්ථාව මඟින් ඊ-සභා ජංගම දුරකථන යෙදවුමට නෛතික බලයක් ලබා දීම.







# පළාත් පාලනයේ දී සක්‍රිය පුරවැසි සහභාගීත්වය ලබා ගැනීම සඳහා ප්‍රජා මණ්ඩල/ ප්‍රජා සංවර්ධන සමිති සවිබල ගැන්වීමේ උපාය මාර්ග හා එහි ප්‍රතිලාභ



## ප්‍රජා මණ්ඩල/ ප්‍රජා සංවර්ධන සමිති පිහිටුවීම පිළිබඳ ඓතිහාසික පසුබිම


ප්‍රජා මණ්ඩල සංකල්පය ඉංග්‍රීසි යටත් විජිත සමයේ දී ආරම්භ වූවකි. පශ්චාත් සංග්‍රාම කාලවල යටත් විජිත පාලකයින් මුහුණ දුන් ප්‍රධාන ගැටලුවක් සහ අභියෝගයක් වූයේ තම යටත් විජිතවල ජන ජීවිත යථා තත්ත්වයට පත් කර ගන්නේ කෙසේ ද යන්නයි. පශ්චාත් යුධ සමයේ කාංසාවට, ආතතියට, සන්ත්‍රාසයට සහ භීතියට පත් ජන සමාජය මානසික ව යථා තත්ත්වයට පත් කිරීමේ අරමුණින් පිහිට වූ ජය සමාජ නැතහොත් 'Victory Volunteer Society' වර්තමාන ප්‍රජා මණ්ඩල සංකල්පයේ මූලාරම්භය විය. ක්‍රීඩා සහ විනෝද කටයුතු සඳහා තරුණ ජනයා යොමු කරවා ගැනීම ජය සමාජවල ප්‍රධාන අරමුණ විය. ජය සමාජ පසුව ප්‍රජා මණ්ඩල නමින් 1969 දී නීති ගත කරන ලදී.

එමගින් සිදු කෙරෙන කාර්ය භාරය වඩාත් සංවිධානාත්මක ව ඉටු කිරීම සඳහා 1969 වසරේ සිට සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාල මට්ටමින් දිස්ත්‍රික් ප්‍රජා මණ්ඩල නිලධාරි තනතුරක් ආරම්භ කරන ලදී. ප්‍රජා මණ්ඩල තවදුරටත් ව්‍යාප්ත වීම හේතුවෙන් 1973 වසරේ දී පළාත් පාලන ආයතන මට්ටමින් පළාත් පාලන නිලධාරීන් (LGO) පත් කරන ලදී.

මහා නගර සභා සහ නගර සභාවලට අනුයුක්ත පළාත් පාලන නිලධාරීන් ප්‍රජා මණ්ඩල ව්‍යාප්ත කිරීම සඳහා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලැබූ අතර සුළු නගර සභා සහ ප්‍රමුඛ මට්ටමේ ගම් සභාවන්හි ද පළාත් පාලන නිලධාරීන් ප්‍රජා මණ්ඩල කටයුතු සංවිධානය කිරීම පිණිස සුවිශේෂී මෙහෙවරක් ඉටු කරන ලදී. 1969 දී නීති ගත කරන ලද ප්‍රජා මණ්ඩල ක්‍රමය 1977 දී නැවත සංශෝධනයට ලක් විය.

මෙලෙස සංශෝධනයට ලක් වූ ප්‍රජා මණ්ඩල පිහිටුවීම පිළිබඳ උපදෙස් මාලාවක් 1977 ඔක්තෝබර් 10 වැනි දින පළාත් පාලන, නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලදී. වඩාත් විධිමත් ප්‍රජා මණ්ඩල ක්‍රමයක් ස්ථාපිත කිරීම මෙම උපදෙස් මාලාව නිකුත් කිරීමේ මූලික අරමුණ විය.

එතැන් සිට ප්‍රජා මණ්ඩල ක්‍රමය ප්‍රදේශයේ පොදු යහපත අරමුණු කර ගෙන ශ්‍රමදාන කඳවුරු පිහිටුවීම, සාමූහික චාරිකා, වාර්ෂික දිස්ත්‍රික් සම්මේලන පැවැත්වීම, පුහුණු පාඨමාලා පැවැත්වීම, සමාජ සේවා කටයුතු, බාහිර සහ අභ්‍යන්තර ක්‍රීඩා, සාහිත්‍යමය කටයුතු, නැටුම්, ගැයුම්, වැයුම් සහ නාට්‍යය, ප්‍රථමාධාර කටයුතු, මාතෘදාරකාභිවෘද්ධි සේවය සහ වෛද්‍ය සේවය, කර්මාන්ත කටයුතු පුහුණුව ආගමික කටයුතු, වගා සංවර්ධනය සහ ප්‍රාදේශීය සංවර්ධනය වැනි අංශ ආවරණය කරමින් ක්‍රියාත්මක විය.





1980 වර්ෂයේ දී එවකට පැවති ගම් සභා සහ සුළු නගර සභා අහෝසි කොට1980 අංක 35 දරණ සංවර්ධන සභා පනත මගින් සෑම දිස්ත්‍රික්කයක් සඳහා ම දිස්ත්‍රික් සංවර්ධන සභා ස්ථාපනය කරන ලදී.

එහි දී එතෙක් පැවැති සුළු නගර සභා 87ක් සහ ගම් සභා 524ක් අහෝසි වූ අතර ඒවායේ සිටි ප්‍රජා මණ්ඩල නිලධාරීන් උප කාර්යාල බවට පත් වූ එකී පළාත් පාලන ආයතනවල කාර්ය භාර නිලධාරීන් යටතේ ප්‍රජා මණ්ඩල නිලධාරීන් වශයෙන් ම ක්‍රියාත්මක වූහ.

මෙම පසුබිම යටතේ 1984 වර්ෂයේ දී පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් ප්‍රජා මණ්ඩල නිලධාරීන්, ප්‍රජා සංවර්ධන නිලධාරීන් ලෙස අන්තර්ග්‍රහණය කර ගනිමින් එම සේවාව දීප ව්‍යාප්ත ව සෑම පළාත් පාලන ආයතනයක් ම ආවරණය වන අන්දමින් ක්‍රියාත්මක කරන ලදී. එතෙක් දිස්ත්‍රික් ප්‍රජා මණ්ඩල නිලධාරීන් ලෙස කටයුතු කළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දිස්ත්‍රික් ප්‍රජා සංවර්ධන නිලධාරීන් ලෙස ප්‍රජා සංවර්ධන නිලධාරීන්ගේ කටයුතු අධීක්ෂණය සඳහා පත් කරන ලදී.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මගින් 1988 වර්ෂයේ සිට ප්‍රාදේශීය සභා 256 ක් දිවයින ම ආවරණය වන පරිදි ස්ථාපනය කරන ලද අතර එකී ආයතනවලට මෙම ප්‍රජා සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කරන ලදී. මේ ආකාර ඉතිහාසයක් හිමි ප්‍රජා මණ්ඩල ක්‍රමය මහා නගර සභා වල දී ප්‍රජා සංවර්ධන සමිති යන නමින් ද අනෙකුත් පළාත් පාලන ආයතනවල දී ප්‍රජා මණ්ඩල යනුවෙන් ද ක්‍රියාත්මක වනු දැකිය හැකි ය.

### ප්‍රජා මණ්ඩල පිහිටු වීමට අදාළ නිර්ණායක

ප්‍රජා මණ්ඩලයක් සඳහා එක් පළාත් පාලන ආයතනයකට අයත් පදිංචිකරුවන් යටත්පිරිසෙයින් 25ක් වත් සිටිය යුතු අතර එම මණ්ඩලයට අයත් ප්‍රදේශය අදාළ පළාත් පාලන ආයතන සීමාව තුළ එම මණ්ඩලය පිහිටි ස්ථානයේ සිට සැතපුම් 2.5ක අර්ධ විෂ්කම්භය තුළ ප්‍රදේශයට සීමා විය යුතු වේ.විශේෂ අවස්ථාවක දී පමණක් යම් ප්‍රජා මණ්ඩලයක පාලන ප්‍රදේශය, ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව වෙනස් කළ හැකිය. ප්‍රජා මණ්ඩලයකට නාමයක් හා ලිපිනයක් තිබිය යුතු අතර, එය පිහිට වූ වහාම පළාත් පාලන ආයතන කාර්යාලයෙහි ලියාපදිංචි කරවීම සඳහා ඉල්ලුම් කළ යුතු ය.

### පළාත් පාලන ආයතනයන්හි ආණ්ඩුකරණ ක්‍රියාවලිය සඳහා ප්‍රජාව සම්බන්ධ කර ගැනීමේ ක්‍රමවේදයක් ලෙස ප්‍රජා මණ්ඩලවල කාර්යභාරය

පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් 1977වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද ප්‍රජා මණ්ඩල පිහිටුවීම පිළිබඳ භාෂාත්‍රයෙන් පළ කරන ලද උපදෙස් මාලාව පළාත් පාලන ආයතනයන්හි ආණ්ඩුකරණ ක්‍රියාවලිය සඳහා ප්‍රජාව සම්බන්ධ කර ගැනීමේ ක්‍රමවේදයක් ලෙස අතිශයින් වැදගත් වේ.

කෙසේ වෙතත් ප්‍රජා ආණ්ඩුකරණ හෙවත් පළාත් පාලන ආයතන ක්‍රියාවලියේ මූලික මට්ටමේ සංවිධානයක් ලෙස ප්‍රජා මණ්ඩල පිහිටුවා බල ප්‍රදේශයෙහි ප්‍රජාවගේ දෛනික ජීවිතයට සෘජු ලෙස බලපාන කරුණු සම්බන්ධයෙන් ප්‍රජා මණ්ඩලයෙහි අදහස් විමසා එහි එකඟතාව මත සංවර්ධන වැඩසටහන් හෝ ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් ප්‍රජා මණ්ඩල ක්‍රමය සාර්ථක කර ගැනීම යහපත්, සංවිධිත සහ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් සඳහා අතිශයින් ම වැදගත් ය.

එම උපදෙස් සංග්‍රහය නිකුත් කර වසර 46 ක පමණ කාලයක් ගත වී ඇතත් මෙම කාලය තුළ සිදු වූ සමාජ, ආර්ථික, දේශපාලනික වෙනස් වීම් සහ නව ප්‍රවණතාවලට ගැළපෙන පරිදි එය සංශෝධනය වී නැත.

## එම උපදෙස් සංග්‍රහය අනුව ප්‍රජා මණ්ඩලයකින් අපේක්ෂිත කාර්යභාරය

- සාමකාමී හා තෘප්තිමත් ප්‍රජාවක් නිර්මාණය කිරීම සඳහා අත්‍යවශ්‍ය ආර්ථික, සමාජීය, සංස්කෘතික, දේශපාලන සහ පාරිසරික ක්ෂේත්‍ර ශක්තිමත් කිරීම.
- තීරණ ගැනීමේ ක්‍රියාවලියට ප්‍රජාව සම්බන්ධ කර ගැනීම.
- සහභාගීත්ව සංවර්ධන සැලසුම් කරණයට දායක වීම.
- ස්වාභාවික පරිසරය සුරක්ෂිත ලෙස පරිහරණය සහ කළමනාකරණයට දායක වීම.
- පුහුණු පාඨමාලා පැවැත්වීමට දායක වීම.
- සමාජ සේවා කටයුතු වැඩි දියුණු කිරීමට දායක වීම.
- බාහිර හා අභ්‍යන්තර ක්‍රීඩා වැඩි දියුණු කිරීමට දායක වීම.
- නැටුම්, ගැයුම්, වැයුම් හා නාට්‍යය ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීමට දායක වීම.

## ප්‍රජා මණ්ඩල පිහිටුවීමෙහි පරමාර්ථය

ප්‍රජා සහභාගීත්වය සහ පොදු එකඟතාව මගින් වඩාත් යහපත්, තෘප්තිමත් සහ තිරසාර සමාජ ජීවිතයක් පවත්වා ගෙන යාමට දායක වීම.

## ප්‍රජා මණ්ඩල පිහිටුවීමෙහි අරමුණු

ප්‍රජා මණ්ඩල බල සීමාවෙහි වාසය කරන සියලු ප්‍රජාව ගේ පොදු යහපත වෙනුවෙන් ක්‍රියාත්මක වන ප්‍රජා මණ්ඩලය පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් ක්‍රියාත්මක විය යුතු ය.

- ප්‍රජාව ගේ විවේක කාලය අර්ථවත් ලෙස ගත කිරීම සඳහා සංස්කෘතික කටයුතු, සාහිත්‍ය සහ කලා කටයුතු මෙන් ම සමාජ සහජීවනය ප්‍රවර්ධනය සඳහා ප්‍රමුඛතාව ලබා දීම.
- ප්‍රජා අභිවෘද්ධිය සඳහා සාමූහික එකඟතා මගින් කළ යුතු හා නො කළ යුතු දෑ තීරණය කිරීම සහ මහජන අදහස් ස්වකීය පළාත් පාලන ආයතනයට ඉදිරිපත් කිරීම.
- පළාත් පාලන ආයතන තුළ ප්‍රජාව නියෝජනය කිරීමේ දී සහ ග්‍රාමීය සංවර්ධනයේ දී ඵලදායී ව්‍යුහයක් ලෙස කටයුතු කිරීම.

- බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන අනෙකුත් සංවිධාන සමග මිත්‍රශීලී සම්බන්ධතා ගොඩ නගා ගැනීම සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- ප්‍රජා මණ්ඩල බල ප්‍රදේශයෙහි තිරසාර සංවර්ධනය සඳහා සහභාගීත්ව සංවර්ධන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම.

**ප්‍රාදේශීය ප්‍රජා බල මණ්ඩලය**

මහා නගර සභා ආඥා පනතේ 29 සහ, ප්‍රාදේශීය සභා පනතේ 12 වගන්ති ප්‍රකාර පත් කරන ස්ථාවර කමිටු හතරෙන් දෙවන ස්ථාවර කමිටුව වන නිවාස හා ප්‍රජා සංවර්ධන ස්ථාවර කමිටුවට මෙම විෂය ඇතුළත් වෙයි.

සෑම පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක් සඳහා ම සියලු ම ප්‍රජා මණ්ඩල නියෝජනය වන පරිදි ප්‍රජා මණ්ඩල සභාපතිවරුන්ගෙන් යුත් ප්‍රාදේශීය ප්‍රජා බල මණ්ඩලයක් පිහිටු විය යුතු ය. එම සභාපතිවරුන්ගේ කැමැත්තෙන් ප්‍රාදේශීය ප්‍රජා බල මණ්ඩලයෙහි සභාපතිවරයෙකු පත් කර ගත යුතු ය. ප්‍රාදේශීය ප්‍රජා බල මණ්ඩලයෙහි ලේකම් තනතුර සඳහා ප්‍රජා සංවර්ධන නිලධාරි නිල බලයෙන් පත් වේ. පළාත් පාලන ආයතනයෙහි පිහිටුවා ඇති කමිටු සඳහා එක් කමිටුවකට යටත් පිරිසෙයින් ප්‍රාදේශීය ප්‍රජා බල මණ්ඩලය නියෝජනය කරමින් දෙදෙනෙකු වත් සම්බන්ධ කර ගැනීම සුදුසු ය.



## මේ ලේඛනය සැකසීම සඳහා පරිශීලනය කළ ග්‍රන්ථ හා ලේඛන


1. පළාත් පාලන ආයතන, 2007, උපුල් අබේරත්න
2. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනයන්හි නෛතික ව්‍යුහය, 2002, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
3. පළාත් පාලන නීතිය හා අතුරු නීති සහ ඒවායේ ක්‍රියාකාරිත්වය, පළාත් පාලන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය
4. පළාත් පාලන නීති, 2007 නීතිඥ එස්. පී. පුංචිහේවා
5. පුරවැසි අත්වැල, 2010, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා
6. පුහුණු මොඩියුලය, පළාත් පාලන ආයතන බලප්‍රදේශයන්හි ප්‍රජා මණ්ඩල පිහිටු වීම, 2018, ජානක හේමතිලක
7. පළාත් පාලන ප්‍රතිසංස්කරණ පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව
8. ශ්‍රී ලංකාවේ පළාත් පාලන නීතිය, ජේ. පී. කීර්තිරත්න
9. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනයන්හි නෛතික ව්‍යුහය, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය.
10. පළාත් පාලන අතුරු ව්‍යවස්ථා සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය.
11. UCLG Country Profiles
12. Country Profile 2017, The Local Government System in Sri Lanka
13. Report of the Commission on Local Government,1955-1
14. 1947 අංක 29 දරන මහා නගර සභා ආඥා පනත
15. 1939 අංක 61 දරන නගර සභා ආඥා පනත
16. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත